බුද්ධ ආචාරධර්ම

Yudda ācāradharma
(Ethics of War)

(A critical study of ethics of war acording to Ramāyana and Mahābhārata)

By

Prof. Saman Chandra Ranasinghe

Published by the Author

2013

පටුන

පිටු අංක

යුද්ධ ආචාරධර්ම පූර්විකාව 13 - 17

ප්‍රථම පරිච්ඡේදය 19 - 22

සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යය.

1.1. රාමායණය හා මහාභාරතය

1.2 මූලාශ්‍රය සහ අධ්‍යයන ක්‍රමවේදය

ද්විතීය පරිච්ඡේදය 23 - 33

යුද්ධ ආචාරධර්ම

2.1 යුද්ධ ආචාරධර්ම මහාභාරතය,
මනුස්මෘතිය හා ජිනීවා සම්මුතිය

2.2 ආචාරධර්ම රක්‍ෂණය හා උල්ලංඝනය
මහාභාරතය හා ඉලියඩ් ග්‍රීක වීරකාව්‍යය

2.3 රාමායණය, ආචාරධර්ම රක්ෂණය හා උල්ලංඝනය

තෘතීය පරිච්ඡේදය 34 -37

යුද්ධ සීමා

3.1 යුද්ධාරම්භය හා අවසානය

3.2 පහර නොදිය යුතු අවස්ථා හා චරිත

චතුර්ථ පරිච්ඡේදය 38 - 47

යුද්ධය පිළිබඳ විවිධ ආකල්ප

4.1 යුද්ධය පිළිබඳ භගවද්ගීතා ආකල්පය.

4.2 යුද්ධය පිළිබඳ රාමායණ-මහාභාරත ආකල්පය

4.3 දූතයන් පිළිබඳ ආකල්පය

පංචම පරිච්ඡේදය 48 - 51

නිගමනය

පාදක සටහන් 52 - 57

යුද්ධ ආචාරධර්ම පූර්විකාව.

'යුද්ධ ආචාරධර්ම' නමින් මෙසේ අද ප්‍රකාශයට පත් වන්නේ දර්ශනසූරි උපාධි අවශ්‍යතාවක් උදෙසා 2000 වර්ෂයේ දී අප විසින් ඉදිරිපත් කරන ලද එක් සම්මන්ත්‍රණ පත්‍රිකාවකි. මෙයට මූලාශ්‍රය වූයේ රාමායණය සහ මහාභාරතය යන සංස්කෘත වීරකාව්‍ය දෙක යි. සංස්කෘත සාහිත්‍යය ආශ්‍රයෙන් යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ ව කැරෙන අධ්‍යයනයක දී අපට යථෝක්ත ග්‍රන්ථ ද්වය අමතක කළ නොහැකි ය.

අපගේ ආචාර්යතුමන්ලා වන මහාචාර්ය මහින්ද පලිහවඩන සහ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ යන කීර්තිමත් සංස්කෘත විද්වතුන් දෙදෙනාගේ සුපරීක්ෂණය යටතේ මෙම අධ්‍යයන සිදු කරන්නට ලැබීම අප ලද භාග්‍යයකි.

අප්‍රමාණ ජීවිත විනාශයකට මග පැදෙන යුද්ධය අප කිසිවකුට අනුමත කළ නොහැකි ය. එහෙත් අප කැමැති වුවත් අකැමැති වුවත් මේ ජීවිත කාලය තුළ දී යුද්ධයකට මුහුණ දීමට හෝ යුද සමයක කටුක ප්‍රතිඵල අත් විඳීමට හෝ අපට සිදු විය හැකි ය. අතීත, වර්තමාන, අනාගත යන කාල භේදයකින් තොර ව මනුෂ්‍යයා මේ තත්ත්වයට මුහුණ දුන් සහ මුහුණ දෙන බව පෙනේ. රාමායණය සහ මහාභාරතය සාක්ෂි දරන්නේ අතීත

භාරතීයයා, යුද්ධයට මානුෂික මුහුණුවරක් දීමට දැරූ ප්‍රයත්නය යි. මෙම ග්‍රන්ථයේ දී ඒ පිළිබඳ ව සනිදර්ශන ව සාකච්ඡා කරනු ලැබ ඇත. ඒ අනුව යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ ව වැඩිදුරටත් විමසිලිමත් වීමේ දී අපට පෙනී ගියේ භෞතික යුද්ධයක ස්වරූපයෙන් ආධ්‍යාත්මික වශයෙන් මනුෂ්‍යයන් වන අපගේ සිත් තුළ ඇතිවන ගැටුම සංකේතවත් ව දැක්වීමට තද් ග්‍රන්ථ රචකයන් විසින් උත්සාහ දරා ඇති බව ය. ඒ අනුව මේ යුද්ධය ආලෝකය සහ අඳුර අතරත් යහපත සහ අයහපත අතරත් යුක්තිය සහ අයුක්තිය අතරත් ඇති වන සටනක් ලෙස ද අර්ථ දැක්විය හැකි ය.

ආලෝකය උදෙසා 'සටන් වදින' සංග්‍රාමිකයකුට අඳුර පරාජය කිරීම හැර වෙනත් විකල්පයක් නැත.

මේ ආලෝක සංග්‍රාමිකයා හඳුනාගැනීමෙහි ලා වන වටිනා ග්‍රන්ථයක් නොබෝදා අපට කියවන්නට ලැබිණ. ඒ පවුලෝ කොය්යෝ නම් විශිෂ්ට ලේඛකයාගේ Manuel du Guerrier de la Lumiere නම් බ්‍රසීල පෘතුගීසි බසින් රචිත කෘතියේ සිංහල පරිවර්තනය වන 'ආලෝකයේ රණකාමියා' ය. පරිවර්තකයා ප්‍රවීණ ලේඛකයකු වන පූජ්‍ය මණ්ඩාවල පඤ්ඤාවංස හිමියෝ ය. මෙවන් පොතක් සිංහල පාඨක ලෝකයට දායාද කිරීමෙන් උන්වහන්සේ විසින් කරනු ලැබ ඇත්තේ මහත් ම පින්කමෙකි.

භෞතික සටන්වල නිරත වන බොහෝ රණකාමීනට සිදු වන්නේ අනුන් විසින් තෝරා දෙනු ලබන භූමිකාවන්හි-චර්යාවන්හි නිරතවීමට ය. එහෙත් යථෝක්ත ග්‍රන්ථය, ආලෝකයේ රණකාමියා එයින් වෙනස් වන ආකාරය මෙසේ පෙන්වා දෙයි.

"ආලෝකයේ රණකාමියෙක් සෙස්සන් විසින් තමා සඳහා තෝරා දෙනු ලබන භූමිකාවක් රඟපානු පිණිස කිසිදාක ස්වකීය ජීවිතය කැප නොකරන්නේ ය."

එසේ නම් ආලෝකයේ රණකාමියා ජීවිතය කැප කරන්නේ කුමට ද ? අපට දැනෙන හැඟෙන අන්දමට ඔහු සිය ජීවිතය කැප කරන්නේ අඳුර ඇති තැනට ආලෝකය ආදේශ කිරීම උදෙසා

ය; අයුක්තිය ඇති තැනට යුක්තිය ආදේශ කිරීම උදෙසා ය; අයහපත ඇති තැනට යහපත ආදේශ කිරීම උදෙසා ය. එහෙයින් භෞතික යුද්ධය පිළිබඳ වන ආචාරධර්ම අපට යට කී උතුම් අරමුණු සාක්ෂාත් කිරීම සඳහා යොදාගත නොහැකි ද ?

මෙහි දී බෞද්ධ සම්ප්‍රදායෙන් ද අපට ලැබෙනුයේ මහත් ම ආලෝකයකි. බම්බලපිටිය වජිරාරාමයේ වැඩ විසූ අතිපූජ්‍ය නාරද ස්වාමීන්ද්‍රයන් වහන්සේ සිය "The Buddha and His Teachings" නම් කෘතියේ සඳහන් කෙළේ එක් අරුතකින් ගත් විට සියලු බෞද්ධයන් ධෛර්යසම්පන්න රණකාමීන් බව ය. ඔවුනට සටනක් තිබේ. එහෙත් ඒ වූ කලී අවි ආයුධ සහ බෝම්බ රැගෙන කරන සටනක් නම් නොවේ. එසේ ම ඔවුහු 'ඝාතකයෝ' ද වෙති. එහෙත් ඔවුන් විසින් ඝාතනය කරනු ලබන්නේ අහිංසක මිනිසුන්, ගැහැණුන් හා ළමයින් නම් නොවේ.

එසේ නම් මේ සටන ඇත්තේ කා සමග ද, කුමක් උදෙසා ද, ඔවුන් විසින් දයා විරහිත ව ඝාතනය කරනු ලබන්නේ කවුද ?

ඔහු සටන් කරන්නේ තමා සමග ය. මන්ද මිනිසාගේ නරක ම සතුරා තමා ම වන බැවිනි. එසේ ම මනස මිනිසකුගේ නරක ම සතුරා මෙන් ම හොඳ ම මිතුරා ද වෙයි. නිර්දය ලෙස ඔවුන් විසින් ඝාතනය කරනු ලබන්නේ රාගය යි, වෛරය යි, අවිද්‍යාව යි. ඒ සදාචාරයෙන්, චිත්ත ඒකාග්‍රතාවෙන් සහ ප්‍රඥාවෙනි. මේ අදහස රැගත් නාරද හිමියන්ගේ පහත සඳහන් ආලෝක ප්‍රකාශය පිළිබඳ සතිමත් වනු වටී.

"In one sense all Buddhists are courageous warriors. They do fight, but not with weapons and bombs. They do kill, but not innocent men, women and children.

With whom and with what do they fight ? Whom do they mercilessly kill ?

They fight with themselves, for man is the worst enemy of man. Mind is his worst foe and best friend. Ruthlessly they

kill the passions of lust, hatred and ignorance that reside in this mind by morality, concentration and wisdom.",

මෙසේ කටයුතු කරන තැනැත්තා කවර දේශයක සිටියත් කවර ජාතියකට අයත් වුවත් කවර ආගමකට අයත් වුවත් බෞද්ධයෙක් ම වෙයි. එසේ කටයුතු නොකරන්නා බෞද්ධ නාමයෙන් හැඳින්වීමට සුදුසුකම් ලබන්නේ නැත.

ආලෝක රණකාමීත්වයේ සුවිශිෂ්ටභාවය අන් කිසිවකින් නොව සිය ජීවිතයෙන් ම ප්‍රකාශයට පත් කළ ගෞතම බුදුන් වහන්සේ අන්ධකාරය නසා මුළු මහත් සමාජය තුළ ආලෝකය ස්ථාපිත කළහ.

බෝධිසත්ත්ව ආදර්ශය ජන්මයක් ජන්මයක් පාසා සිය චර්යාවෙන් ම ප්‍රකාශයට පත් කළ මේ උත්තම චරිතය, සිය අවසන් ජන්මය ලැබුවේ සිද්ධාර්ථ කුමරු ලෙස ය. අනතුරුව අන් බොහෝ ජන්මයන්හි දී මෙන් එම ජන්මයේ දීත් සත්‍යගවේෂී මාර්ගයට පිළිපන් සිද්ධාර්ථ නමැති මේ 'ආලෝක රණකාමියා' සිය අන්තිම සටන ජය ගත්තේ අතීත, වර්තමාන, අනාගත යන කාල භේදයකින් තොර ව අප්‍රමාණ ආලෝක රණකාමීනට ජයග්‍රහණ ලබා ගැනීමෙහිලා වන මාර්ගය පෙන්වා දෙමිනි. හිංසාවෙන් තොර ව ආචාරධර්ම සහිත ධර්ම සංග්‍රාමයක අඛණ්ඩ ව නිරත වූ උන්වහන්සේ බුද්ධත්වය ලද මොහොතේ පහත සඳහන් උදානය පළ කළ හ.

"මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු
චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි,
විජ්ජා උදපාදි, ආලොකො උදපාදි
අකුප්පා මෙ චෙතො විමුත්ති, අයමන්තිමා ජාති
නත්ථිදානි පුනබ්භවොති.

භික්ෂුණී, මට පෙර නොඇසූ විරූ දහම්හි ඇස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, දැක්ම පහළ විය, ආලෝකය පහළ විය.

මගේ චිත්ත විමුක්තිය චංචල කළ නොහැකි ය. මේ අන්තිම ජාතිය යි. මීට පසු පුනර්භවයක් හෙවත් නැවත වීමක් නැත."

මේ දහම් දෙසුම ඇසූ පස්වග භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිබඳ ව සතුටු වූ බව සඳහන් ය. ඒ අතුරින් මෙතෙක් ගත කළ ජීවිතය පිළිබඳ ඉමහත් වෙනසක් සිදු වන්නේ කොණ්ඩඤ්ඤ භික්ෂූන් වහන්සේ තුළ ය. ඒ වෙනස ගැන ධර්මයෙහි සඳහන් වන්නේ මෙසේ ය.

"... ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං
ධම්මචක්ඛුං උදපාදි"

කොණ්ඩඤ්ඤ ආයුස්මතුන් වහන්සේට රජසින් තොර මලින් තොර දහම් ඇස ඇතිවිය."

ඔබ අප කාටත් ඒ දහම් ඇස පහළ වේවා !

සමන් චන්ද්‍ර රණසිංහ

ප්‍රථම පරිච්ඡේදය

සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යය

1.1 රාමායණය සහ මහාභාරතය

සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යයට අයත් ප්‍රධාන ග්‍රන්ථ ද්වය වන්නේ වාල්මීකි ඍෂිවරයා විසින් ලියන ලදැ යි සැලකෙන රාමායණය සහ ව්‍යාස ඍෂිවරයා විසින් ලියන ලදැ යි සැලකෙන මහාභාරතය යි. බාල, අයෝධ්‍යා, අරණ්‍ය, කිෂ්කින්ධා, සුන්දර, යුද්ධ සහ උත්තර යන කාණ්ඩ සතෙකින් යුක්ත රාමායණය ශ්ලෝක විසිහතර දහසකින් සමුපේත යි. මෙම වීරකාව්‍යය ආදිකාව්‍යය නමින් ද ප්‍රචලිත යි.

ශ්ලෝක ලක්ෂයකින් සමන්විත මහාභාරතය පර්ව හෙවත් ප්‍රධාන කොටස් දහ අටකින් යුක්ත යි. ආදි, සභා, වන, විරාට, උද්‍යොග, භීෂ්ම, ද්‍රෝණ, කර්ණ, ශල්‍ය, සෞප්තික, ස්ත්‍රී, ශාන්ති, අනුශාසන, අශ්වමෙධික, ආශ්‍රමවාසික, මෞසල, මහාප්‍රස්ථානික සහ ස්වර්ගාරෝහණික යන පර්ව පිළිවෙළින් මෙහි අන්තර්ගත යි. මහාභාරතයට පසුව එකතු කරන ලදැ යි සැලකෙන හරිවංශය ද එහි ම කොටසක් ලෙස සැලකුවහොත් මහාභාරතය සැලකිය යුත්තේ පර්ව දහනවයකින් යුක්ත ග්‍රන්ථයක් ලෙස යි.

ලංකාධිපති රාවණ විසින් රාම පත්නිය වූ සීතා ලංකාවට පැහැරගෙන ඒමත් ඇය මුදාගැන්ම සඳහා රාම, සේනා කැටුව පැමිණ, රාවණ සේනා සමග යුද කොට රාවණ පරාජය කොට

සීතා රැගෙන පෙරළා භාරතයට යෑමත් රාමායණයේ විස්තර වන ප්‍රධාන සිදුවීම යි.

පාණ්ඩව සහ කෞරව යන රාජවංශික ඥාති දෙපිරිසක් අතර ඇති වන මහා සංග්‍රාමයක් පිළිබඳ ව මහාභාරතයේ වර්ණනය කැරෙයි. දූර්යෝධන ප්‍රධාන කෞරව පුත්‍රයන් විසින් තමන්ට හිමි රාජ්‍යය පවරා නොදීම නිසා කෝපයට පත් වන යුධිෂ්ඨිර, භීම, අර්ජුන, නකුල සහ සහදේව යන පංච පාණ්ඩවයන් සිය උරුමය ලබාගැනීම සඳහා සිය හිතෙෂී සේනා සමග සංග්‍රාමාවතීර්ණ වන ආකාරයත් අවසානයේ දී ඔවුන් ජයග්‍රහණය ලබන ආකාරයත් මහාභාරතයේ වර්ණිත යි.

අතීත ග්‍රීක සමාජය තුළ පැවැති යුද්ධය සහ එහි ස්වභාවයන් පිළිබඳ ව ගවේෂණය කරන පර්යේෂකයකුට ග්‍රීක මහා වීරකාව්‍ය ද්වය වන ඉලියඩ් සහ ඔඩිසි (The Iliad and The Odyssey) වැදගත් වන්නේ යම් සේ ද, යුද්ධය පිළිබඳ ව අතීත භාරතීයයන්ගේ ආකල්ප ගවේෂණය කරන පර්යේෂකයකුට රාමායණය සහ මහාභාරතය කිසිසේත් අමතක කළ නොහැකි ය. එහෙයින් යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ ව කැරෙන විවරණයක දී අනිවාර්යයෙන් ම රාමායණය සහ මහාභාරතය පාදක කොට ගත යුතු වෙයි. විවිධ සමාජ, ආර්ථික, කරුණු පිළිබඳ කොතෙකුත් විස්තර අන්තර්ගත වන රාමායණ, මහාභාරත මහා ග්‍රන්ථද්වය ම දිගින් දිගට ම විකාසනය වන්නේ යුද්ධය පදනම් කොට ගෙන යි. එහෙයින් සංස්කෘත මූලාශ්‍රය පදනම් කොට ගනිමින් යුද්ධය පිළිබඳ ව කැරෙන අධ්‍යයනයක දී රාමායණය සහ මහාභාරතය මූලාශ්‍රය කොට ගැන්ම සුදුසු වනවා පමණක් නො ව අනිවාර්යයෙන් ම කළ යුතු කාර්යයක් ද වෙයි.

1.2 මූලාශ්‍රය සහ අධ්‍යයන ක්‍රම වේදය

මූලාශ්‍රය රාමායණය සහ මහාභාරතය යි.

යුද්ධය පිළිබඳ ආචාරධර්ම පැහැදිලි කිරීමේ දී ප්‍රස්තුත මාතෘකාවට අදාළ වන පරිදි අවශ්‍ය ම තැනක දී පමණක්

ග්‍රීක වීර කාව්‍ය ද්වය වන "ඉලියඩ් සහ ඔඩිසි" හි ඉංග්‍රීසි පරිවර්තන ආශ්‍රය කොට ගැනෙයි.

එදා සහ අද අතර යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ සමවිෂමතා පැහැදිලි කරගැන්ම සඳහා අදාළ පරිදි යුද්ධය පිළිබඳ කරුණු සඳහන් පැරණි සහ නූතන මූලාශ්‍රය ආශ්‍රය කැරේ.

සංස්කෘත මූලාශ්‍රය පාදක කොට ගනිමින් යුද්ධය පිළිබඳ කරුණු සොයා යන පර්යේෂකයකුට 'ධර්මයුද්ධ' සහ 'කූටයුද්ධ' යන සංකල්ප දෙක හමු වෙයි. 'ධර්මයුද්ධ සංකල්ප' අවධාරණ කැරෙමින් යුද්ධයේ ආචාරධර්ම සාකච්ඡාවට ලක් වන්නේ යට කී පරිදි සංස්කෘත වීරකාව්‍ය ද්වයේ ය. 'කූටයුද්ධය' පිළිබඳ ව කරුණු ලබා ගැන්මේ දී වෙසෙසින් වැදගත් වන්නේ 'කෞටිලීය අර්ථශාස්ත්‍රය යි. 'කූටයුද්ධය' වූ කලී වෙන ම අධ්‍යයනයක් කිරීම සඳහා තරම් වන පෘථුල ක්ෂේත්‍රයකි. මෙම පර්යේෂණයේ අභිප්‍රේතාර්ථය සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යය ආශ්‍රයෙන් යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ ව සාකච්ඡා කිරීම වන හෙයින් 'කෞටිලීය අර්ථශාස්ත්‍රය' මෙහි දී භාවිතයට ගෙන නැත.

සංස්කෘත සාහිත්‍යයට අයත් පෘථුල සාහිත්‍යාංගයක් වන ධර්මසූත්‍ර ග්‍රන්ථවල ද 'ධර්මයුද්ධ' සහ 'කූටයුද්ධ' යන සංකල්ප දෙක ම සාකච්ඡාවට ලක් වෙයි. මෙහි දී එම 'ධර්මසූත්‍ර' ග්‍රන්ථ නො ව එක්තරා මට්ටමකින් ඒ ගණයෙහි ලා සැලකිය යැකි, එසේ ම ප්‍රස්තුත මාතෘකාව සමග ඍජු ව ම සම්බන්ධ කළ හැකි 'මනුස්මෘතිය' හෙවත් 'මානවධර්මශාස්ත්‍ර' ආශ්‍රය කැරෙයි.

රාමායණය සහ මහාභාරතය පරිශීලනය කිරීමෙන් ලබාගත් දත්ත අනුසාරයෙන් යුද්ධයේ ආචාරධර්ම පැහැදිලි කැරෙයි.

යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ පැහැදිලි ප්‍රකාශ හමු වන්නේ මහාභාරතයේ බැවින් ආචාරධර්ම පෙළ ගැස්වීමේ දී එම ග්‍රන්ථයට විශේෂ අවධානය යොමු කොට ඇත. අවශ්‍ය පරිදි රාමායණයෙන් ද කරුණු ගැනෙයි.

මෙහි දී මුලින් ම කැරෙන්නේ යථෝක්ත වීරකාව්‍ය ද්වයෙහි යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ ව සඳහන් වන තැන් අවශ්‍ය පරිදි

අදාළ උද්ධෘත සහිත ව දක්වමින් එම ආචාරධර්ම පෙළ ගැස්වීම යි.

අනතුරුව එම ආචාරධර්ම රැකුණු සහ උල්ලංඝනය වූ අවස්ථා එම ග්‍රන්ථානුසාරයෙන් සනිදර්ශන ව ඉදිරිපත් කොට යුද්ධයේ ආචාරධර්ම සමාලෝචනය කැරෙයි.

මෙම අධ්‍යයනයේ දී භාරතීය සමාජය පිළිබඳ ව අත්දැකීම් ඇති ලාංකේය සහ ඇතැම් භාරතීය විද්වතුන් සමග කළ සාකච්ඡා ද ප්‍රයෝජනවත් විය. එසේ ම ග්‍රීක සාහිත්‍යය පිළිබඳ ව හදාළ ලාංකේය පඬිවරුන් සමග කළ සාකච්ඡා ද මෙහි දී වැදගත් විය.

මෙම අධ්‍යයනයෙහි දී පහත සඳහන් දෘෂ්ටිකෝණ තුන උපයෝගි කොට ගැනෙයි.

i. යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ ව කතුවරයා ඍජු ව ම ඉදිරිපත් කරන ප්‍රකාශ

ii. සංස්කෘත වීරකාව්‍ය ද්වයේ නිරූපිත චරිත ලවා ආචාරධර්ම පිළිබඳ ව කැරෙන ප්‍රකාශ

iii. ඒ ඒ චරිතවල ක්‍රියාකාරිත්වයෙන් ආචාරධර්ම රැකීමේ හෝ නොරැකීමේ අවස්ථා හඳුනා ගැනීම.

මෙහි දී මෙම දෘෂ්ටිකෝණ ත්‍රය මෙම අනුපිළිවෙළට ම භාවිතයට ගෙන නැත. ඒ ඒ අවස්ථාවලට සුදුසු පරිදි ඒවා ප්‍රයෝජනයට ගෙන ඇත.

ද්විතීය පරිච්ඡේදය

යුද්ධ ආචාරධර්ම

2.1 මහාභාරතය, මනුස්මෘතිය සහ ජිනීවා සම්මුතිය.

යුද කිරීමේ දී පිළිපැදිය යුතු ආචාරධර්ම පිළිබඳ ව කෞරව - පාණ්ඩව යන දෙපක්ෂය විසින් ම ඇති කරගත් ගිවිසුමක් පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් මහාභාරතයේ භීෂ්ම පර්වයේ ආරම්භක අධ්‍යායයේ ම දක්නට ලැබේ. යුද්ධයේ ආචාරධර්ම සම්බන්ධයෙන් සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යය තුළ දෘශ්‍යමාන පැහැදිලි ප්‍රකාශය වන්නේ ද එය යි. එහෙයින් පළමු කොට ඒ ආචාරධර්ම ප්‍රකට කැරෙන පද්‍ය උද්ධෘත කොට දක්වා අනතුරු ව ඉන් කියැවෙන ආචාරධර්ම වෙන් වෙන් ව ගෙන සාකච්ඡාවට ලක් කළ හැකි ය.

"වාචා යුද්ධප්‍රවෘත්තානං වාචෛව ප්‍රතියොධනම්
නිෂ්ක්‍රාන්තාඃ පෘතනාමධ්‍යාන්න හන්තව්‍යාඃ කදාචන

රථී ච රථිනා යොධ්‍යො ගජෙන ගජධූර්ගතඃ
අශ්වෙනාශ්වී පදාතිශ්ච පාදාතෙනෛව භාරත

යථායොගං යථාකාමං යථොත්සාහං යථා බලම්
සමාභාෂ්‍ය ප්‍රහර්තව්‍යං න විශ්වස්තෙ න විහ්වලෙ

එකෙන සහ සංයුක්තඃ ප්‍රපන්නො විමුඛස්තථා
ක්ෂීණශස්ත්‍රො විවර්මා ච න හන්තව්‍යඃ කදාචන

න සූතෙෂු න ධූර්යෙෂු න ච ශස්ත්‍රොපනායිෂු
න භෙරිශඞ්ඛවාදෙෂු ප්‍රහර්තව්‍යං කථංචන!"

මෙහි කියැවෙන අන්දමට යුද්ධයේ දී වචනයෙන් අභියෝග කරන අය සමග ප්‍රතියුද්ධ කළ යුත්තේ වචනයෙන් ම ය.

යුද බිමෙන් පලා යන්නන් කිසි විටෙකත් නොනැසිය යුතු ය.

රථිකයා රථිකයකු සමග ද ගජාරෝහකයා ගජාරෝහකයකු සමග ද ආශ්වාරෝහකයා අශ්වාරෝහකයකු සමග ද පාබළයා පාබළයකු සමග ද යුද කළ යුතු ය.

සම දක්ෂතා සම බල සම උත්සාහ ඇති අය යුද කළ යුත්තේ තමාට සැමතින් ම සදෘශ අය සමග යි. අභියෝග කොට පහර දිය යුතු ය. විශ්වාසයෙන් එළඹෙන තැනැත්තා කෙරෙහි ද මුළාවට පත් තැනැත්තා කෙරෙහි ද පහරදීම නොකළ යුතු ය.

එසේ ම දෙදෙනෙකු ඔවුනොවුන් හා යුද කරද්දී තෙවැන්නකු එ තැනට මැදිහත් වී පහර දීම ධර්මය නොවේ. තව ද යටත් වූ විමුඛ වූ හෝ අවි ගිලිහුණු හෝ ආරක්ෂක ආවරණ අහිමි වූ අය හෝ කිසි විටෙකත් නොනැසිය යුතු ය.

සූතයන් කෙරෙහි යුද්ධයට සම්බන්ධ නොවන ධූරයන්හි නිරත වූවන් කෙරෙහි අවි ගෙන යන්නන් කෙරෙහි බෙර සක් වයන්නන් කෙරෙහි හෝ කිසි විටෙකත් පහර නොදිය යුතු ය.

මේ අදහස් සිහිපත් කරවන ප්‍රකාශ කීපයක් අපට මනුස්මෘතියෙන් හමු වෙයි. එහි සඳහන් වන අන්දමට රථාරූඪ වූ තැනැත්තා විසින් බිම සිටින තැනැත්තාට පහර නොදිය යුතු ය. එසේ ම නපුංසකයනට, වැඳවැටෙන්නවුනට, මුදා හළ කෙස් ඇත්තනට. හිඳගෙන සිටින්නනට සහ යටත් යැයි පවසන අයට ද පහර නොදිය යුතු ය.

තව ද නිදිගත්, සන්නාහවියුක්ත, නග්න, නිරායුධ, යුද නොකරන, යුද්ධය නරඹන සහ අනිකකු සමග යුද කරන තැනැත්තා ද නොනැසිය යුතු ය.

එසේ ම සත්පුරුෂයන්ගේ ධර්මය සිහි කරමින්, යුද අවි කැඩුණු අයට, පීඩිතයනට, සැමතින් ම සියල්ල අහිමි වූවනට, භීතියට පත් වූවනට සහ ආපසු හැරුණු අයට පහර නොදිය යුතු ය.[2]

මෙහි දී ම යුදබිමෙහි තුවාල ලැබූවන්ගේ සහ රෝගී වූ අයගේ සහනය පිණිස 1929 ජූලි 27 වන දින ඇති කරගන්නා ලද 'ජිනීවා සම්මුතිය' දෙසට ද අපේ අවධානය යොමු කරනු වටී. මෙම සම්මුතිය යුදබිමෙහි දී තුවාල ලද හෝ රෝගාතුරවූවන් කෙරෙහි වෙසෙස් සැලකිල්ලක් දක්වා තිබෙන බව එය අධ්‍යයනය කිරීමෙහි දී පෙනේ. එහි සඳහන් වන අන්දමට එබඳු අය සැමතින් ම ගෞරවණීය ලෙස ආරක්ෂා කළ යුතු වේ.

ලිංගය, ගෝත්‍රය, ජාතිය, ආගම, දේශපාලනික අදහස් හෝ එබඳු කවර විභින්නතා තුබුණත් ඒ නොතකා ඔවුනට ඖෂධ ආදිය ලබා දී මානුෂික ලෙස සැලකිය යුතු ය. ඔවුන්ගේ ජීවිතවලට පමණක් නො ව එම ජීවිතවලට සම්බන්ධ සෙසු ජීවිතවලට ද හිංසා කිරීම සපුරා තහනම් වේ. විශේෂයෙන් කුරිරු වධ හිංසාවලට ලක්-කොට හෝ ජීව විද්‍යාත්මක පර්යේෂණවලට බඳුන් කොට ඔවුන් මරා-දැමීම හෝ සමූලඝාතනය කිරීම ද නොකළ යුතු ය. එසේ ම වෛද්‍ය පහසුකම් සහ ආරක්ෂාව නොදී ඔවුන් හිතුවක්කාර ලෙස අතහැර දැමීම ද නොකළ යුතු ය. එපමණක් නො ව ඔවුන් වසංගතවලින් මෙන් ම විෂබීජ ශරීරගතවීම්වලින් ද ආරක්ෂා කොට ගත යුතු ය.[3]

2.2 ආචාරධර්ම රක්ෂණය හා උල්ලංඝනය. මහාභාරතය සහ ඉලියඩ් ග්‍රීක වීරකාව්‍යය.

මෙයිනික්බිති ව සංස්කෘත වීරකාව්‍යවල සඳහන් ආචාර-ධර්ම රැකුණු සහ නොරැකුණු අවස්ථා පිළිබඳ ව එම වීරකාව්‍ය ආශ්‍රයෙන් ම කරුණු සාකච්ඡා කිරීම සුදුසු යැ යි සිතේ.

වචනයෙන් යුද්ධයට කැඳවන අවස්ථාවේ දී ඊට පිළිතුරු දිය යුත්තේ වචනයෙනි. මහාභාරතයේ එන භීම සහ දුර්යෝධන අතර ආයුධමය යුද්ධය ආරම්භ වීමට පෙර ඇති වන්නේ වාඞ්මය යුද්ධය යි. දුර්යෝධන නිසා අපමණ යුද වීරයන් ලොවට අහිමි වූ බව කියන භීම, ගදායුධයෙන් ගසා ඔහු නසන බව කියයි.

"ත්වාමප්‍යද්‍ය හනිෂ්‍යාමි ගදයා නාත්‍ර සංශයඃ"[4]

මෙයට පිළිතුරු දෙන දුර්යෝධන වාගාලාප නවතා තමා සමග යුද කරන මෙන් ද යුද්ධයේ දී භීම තමාගෙන් නැසෙන බව ද පවසයි.

"කිං කත්ථනෙන බහුනා යුධ්‍යස්ව ත්වං වෘකොදර
අද්‍ය තෙ'හං විනෙෂ්‍යාමි......."[5]

මෙසේ දිගින් දිගට ම වාඞ්මය යුද්ධය කෙරී ගෙන ගොස් අනතුරුව එය ආයුධමය යුද්ධයක් බවට පත් වෙයි.

ශල්‍ය පර්වයේ තිස්තුන්වන අධ්‍යාය පුරා දැකිය හැක්කේ ද භීම සහ දුර්යෝධන අතර ඇති වන වාඞ්මය යුද්ධය යි.

යුද බිමෙන් පලා යන්නනට එලවා ගොස් පහර දීම ආචාර-ධර්මයක් නො වේ. එහෙත් භීම මෙය උල්ලංඝනය කරයි. ඔහු තමාට බියෙන් පලායන කෞරවයන් පසුපස එලවා ගොස් ඔවුන් තියුණු හී පහරවලින් නසයි.

"තතස්තාං කෞරවීසේනාං ද්‍රවමාණාඃ සමන්තතඃ
තිස්තත් භීමඃ ශරෛස්තීක්ෂ්ණෛරනුවව්‍රාජ පෘෂ්ටතඃ"[6]

ඇතුන් පිට සිටින්නන් එවැන්නන් සමගත් රථිකයන් රථිකයන් සමගත් අශ්වාරෝහකයන් අශ්වාරෝහකයන් සමගත්

පාබළයන් පාබළයන් සමගත් යුද්ධ කළ යුතු ය යන ආචාරධර්මය මහාභාරත යුද්ධයේ පළමු දිනයේ දී රැකෙයි. ඒ බව කතුවරයා ධෘතරාෂ්ට්‍ර රජුගේ සූතයා වශයෙන් කටයුතු කරන සංජය මුවින් මෙසේ ඉදිරිපත් කරයි.

"ගජො ගජෙන සමරෙ රථිනං ච රථී යයෞ
අශ්වො'ශ්වං සමභිප්‍රායාත් පදාතිශ්ච පදාතිනම්"[7]

එහෙත් පසුව ඒ තත්ත්වය වෙනස් වනු පෙනේ. ඉහත සඳහන් පරිදි යුද්ධයේ ආචාරධර්ම රැකුණු ආකාරය ගැන ධෘතරාෂ්ට්‍ර රජුට පැවැසූ සංජයට ම ඒ යුදබිමේ දී ම සිය ඇස් පනාපිට ආචාරධර්ම උල්ලඞ්ඝනය වන ආකාරය ඒ රජුට ම පෙන්වා දීමට සිදු වෙයි.

රථිකයෝ රථිකයන්ට නොව පදාතීනට පහර දෙති. අශ්වාරෝහකයෝ අශ්වාරෝහකයනට පහර නොදී අන්‍යයනට පහර දෙති. ඇත් සේනා ද ගිවිසුම උල්ලංඝනය කරන අතර ඔවුහු ඔවුනොවුන් සමග සාහසික ව යුද කරති.

"රථිනඃ පත්තිභිඃ සාර්ධං සාදිනශ්චාපි පත්තිභිඃ
අන්‍යෝන්‍යං සමරෙ රාජන් ප්‍රත්‍යධාවන්නමර්ෂිතාඃ"[8]

යුදබිම තුළ ඇති උමතු සාහසික වේශය සංජය දකියි. ඔහු යුදබිමෙහි දී ආචාරධර්ම උල්ලංඝනය වන ආකාරය මෙසේ ධෘතරාෂ්ට්‍ර රජුට විස්තර කරන්නේ සංවේගයෙනි.

"න හ්‍යනීකමනීකෙන සමසජ්ජත සංකුලෙ
රථා න රථිභිඃ සාර්ධං පදාතා න පදාතිභිඃ

අශ්වා නාශ්වෛරයුධ්‍යන්ත ගජා න ගජයොධිභිඃ
උන්මත්තවද් මහාරාජ යුධ්‍යන්තෙ තත්‍ර භාරත"[9]

අර්ජුන සහ කර්ණ අතර අවස්ථා කිහිපයක දී ම ද්වන්ද්ව සටන් ඇතිවන අතර ඒ බොහෝ අවස්ථාවල දී දෙදෙනා ම ආචාරධර්ම රකිති. එහෙත් මේ දෙදෙනා අතර වූ අවසන් යුද්ධයේ දී කර්ණගේ රථය මඩෙහි එරෙන අතර ඔහු දෑතින් ම රථ රෝදය අල්ලා රථය ගොඩ ගැන්මට සැරසෙද්දී කෘෂ්ණගේ මෙහෙයීම

පිට අර්ජුන, නිරනුකම්පික ව කර්ණ මරා-දමයි. රථය එරුණු මොහොතේ කර්ණ පවසන පහත සඳහන් ප්‍රකාශය ද යුද්ධයේ ආචාරධර්ම මතු කරගැන්මට අපට උපකාර කරයි.

"විශිෂ්ටතරමෙව ත්වං කර්තුමර්හසි පාණ්ඩව
ප්‍රකීර්ණකෙශෙ විමුඛෙ බ්‍රාහ්මණේ'ථ කෘතාඤ්ජලෞ

ශරණාගතෙ න්‍යස්තශස්ත්‍රෙ යාචමානෙ තථාර්ජුන
අබාණෙ භ්‍රෂ්ටකවචෙ භ්‍රෂ්ටාමග්නායුධෙ තථා

න විමුඤ්චන්ති ශස්ත්‍රාණි ශූරා සාධුව්‍රතෙ ස්ථිතාඃ"[10]

මෙහි කියැවෙන හැටියට විසුරුණු කෙස් ඇති පරාඞ්මුඛ වූවන් එනම් තමාට පිටුපා සිටින අය කෙරෙහි ද බැඳැදිලි ඇති බ්‍රාහ්මණයා කෙරෙහි ද ශරණ සොයා පැමිණි තැනැත්තා කෙරෙහි ද ආයුධ බිම බහා තුබූ තැනැත්තා කෙරෙහි ද ආයාචනාත්මක වදන් පවසන්නා කෙරෙහි ද හී ඉවතලූවන් කෙරෙහි ද ගිලිහුණු කවච ඇත්තන් කෙරෙහි ද වැටුණු ආයුධ ඇත්තන් කෙරෙහි ද සාධු ව්‍රතයෙහි පිහිටි සත්පුරුෂයෝ ආයුධ නොයොදති.

යුදබිමෙහි දි ද්‍රෝණ පුත් අශ්වත්ථාමා මරා දැමූ බව පාණ්ඩවයෝ ප්‍රචාරය කරති. මෙය අසන ද්‍රෝණ බ්‍රාහ්මණ ආචාර්යවරයා සිය ආයුධ අතහැර බිම හිඳ ධ්‍යානපරායණ වෙයි. මේ අවස්ථාවේ දී තමාට පිටුපා ආයුධ අතහැර ධ්‍යානයෝගී ව වෙසෙන ද්‍රෝණ වෙත පැමිණෙන ධෘෂ්ටද්‍යුම්න කඩුපහර දී ඔහු මරා දමයි.[11]

තමා වෙත ශරණ සොයා පැමිණි, ජීවිත දානය දෙන්නැයි අයදින අය මරා දැමීමේ ප්‍රවණතාව මහාභාරත යුද්ධයේ හෝ රාමායණ යුද්ධයේ හෝ දැකිය හැකි නො වේ. එහෙත් ආයුධ පසෙක ලා වෙන අරමුණක සිත යොදන විට මරා දැමූ අවස්ථා නම් අපට සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යය තුළ හමු වෙයි. කලිනිදු සඳහන් කළ පරිදි අර්ජුන අතින් කර්ණ මැරුම් කන ආකාරය එබඳු අවස්ථාවකට නිදසුනකි.

අභයදානය ඉල්ලා කන්නලව් කරද්දී ඔවුන් මරා දැමීම සංස්කෘත වීරකාව්‍ය සාහිත්‍යයට ආගන්තුක වුවත් ග්‍රීක වීරකාව්‍යයක් වන ඉලියඩ්හි එබඳු අවස්ථා කීපයක් ම දක්නට ලැබේ. මෙනලවුස් විසින් අභය දානය දුන් ඇඩ්රෙස්ටස් (Adrestos) ජීවිතය දෙන්නැ යි යදිද්දී ඇගමෙම්නොන් විසින් මරා දමනු ලැබීම ඉන් එකකි.[12] අභය දානය යැදි දෝලන් (Dolen) ඩයෝමිඩීස් (Diomedes) විසින් මරා දමනු ලැබීම තවත් අවස්ථාවකි.[13] එසේ ම ඇන්ටිමාකෝස්ගේ (Antimachos) දරුවන් දෙදෙනා වන පයිසන්ඩ්‍රොස් (Peisandros) සහ හිපලොකුස් (Hippolochos) සිය ධනය ලබාගෙන තමන් නිදහස් කරන්නැ යි අයැදිද්දී ඇගමෙම්නොන් විසින් ඝාතනය කරන ලද ක්‍රෑර ආකාරය යුද්ධයේ ආචාරධර්ම උල්ලඞ්ඝිත අවස්ථාවක් ප්‍රකට කරන්නකි.[14]

ආචාරධර්ම අනුව සටන් කිරීම වීරත්වය මැනීමේ උරගල නම් ඉහත සඳහන් ඇගමෙම්නොන් හෝ නිරායුධ ද්‍රෝණ මරා දැමූ ධෘෂ්ටද්‍යුම්න හෝ සිය යුද රථය ගොඩ ගන්නට සැරසුණු කර්ණ මරා දැමූ අර්ජුන හෝ යුද වීරයෝ නොවෙති. එසේ ම අතීතයේ ලියැවුණු ග්‍රීක සහ සංස්කෘත සාහිත්‍ය මූලාශ්‍රය පමණක් නොව නූතන යුද නීතිය යටතේ වර්තමානය ද ඔවුනට උරුම කොට දෙන්නේ වුදිතයන්ගේ භූමිකාව යි.

"It is forbidden to kill or wound an enemy who having laid down his arms,..."[15]

සම දක්ෂතා, සම බල, සම උත්සාහ ඇති අය අතර පමණක් යුද්ධ ඇති විය යුතු ය යන්නට නිදර්ශන රාශියක් සැපයිය හැකි ය. අර්ජුන සහ කර්ණ, භීම සහ දුර්යෝධන, ධෘෂ්ටද්‍යුම්න සහ ද්‍රෝණ, පරශුරාම සහ භීෂ්ම, කෘෂ්ණ සහ ශිශුපාල, යුධිෂ්ඨිර සහ ශල්‍ය අතරත් ඇති වන යුද්ධ සමානයන් අතර ඇති වන යුද්ධ සඳහා මහාභාරතයෙන් දිය හැකි නිදසුන් කීපයකි. රාම සහ රාවණ, ලක්ෂ්මණ සහ ඉන්ද්‍රජිත්, රාවණ සහ ජටායු අතර ඇති වන යුද්ධ මේ සඳහා රාමායණයෙන් දිය හැකි නිදසුන් කීපයකි.

සමාන දක්ෂතා ඇති අය ඔවුනොවුන් හා යුද වැදීමේ ආචාරධර්මය මහාභාරත යුද්ධය මුල් දිනයේ දී බොහෝ දුරට රැකේ. ඒ අවස්ථාව මහාභාරතයේ මෙසේ වර්ණිත යි.

"තතො යුද්ධං සුදුර්ධර්ෂං ව්‍යාකුලං සමපද්‍යත
ශූරාණාං සමරෙ තත්‍ර සමාසාද්‍යෙ'තරෙතරම්"[16]

යුද්ධය දිගින් දිගට ම පවතිද්දී ඇතැම් අවස්ථාවක මේ තත්ත්වය රැකෙන අතර තවත් අවස්ථාවක දී එසේ සිදු නොවේ. එසේ ම දෙදෙනකු අතර ඇති වූ එක ද්වන්ද්ව සටනක් ආචාර-ධර්ම රැකීම සහ නොරැකීම යන අවස්ථා දෙකට ම සාක්ෂි දරයි. වරෙක භීමසේන සහ ජරාසන්ධ යන දෙදෙනා අතර ද්වන්ද්ව සටනක් ඇති වෙයි. විවිධ ආයුධවලින් සටන් කරන දෙදෙනා අවසානයේ දී බාහුවලින් යුද කරති. මේ මල්ලව පොරය ආචාර ධර්ම සහිත ව කෙරී-ගෙනයයි. එහෙත් පසුව පසෙක සිට කෘෂ්ණ, සටන් කළ යුතු ආකාරය ගැන භීමට උපදෙස් දෙයි. ඒ අනුව කටයුතු කරන භීම, ජරාසන්ධ දෙකට ඉරා ඒ දෙකඩ දෙපසට විසි කොට මරා දමයි.[17]

ඒ. එල්. බෂාම් සිය 'The Wonder that was India' නම් කෘතියේ විස්තරාත්මක ව පැරණි භාරතීය යුද්ධය පිළිබඳ කරුණු විමර්ශනය කරයි. නීති රැකීමට පිළිණ දුන් අය ම ඒවා සිඳ දමන සැටි, පරාජය පෙනෙන විට, ආත්මාරක්ෂාව පිළිබඳ හැඟීම ඉස්මතු වී මිනිසාට සියල්ලට ම වඩා සිය ජීවිතය වැදගත් වී ආචාරධර්ම උල්ලංඝනය කරන සැටි, ජයග්‍රහණය පෙනෙන විට සිය ජය සහතික කරගැන්ම සඳහා ආචාරධර්ම කඩ කිරීමට මිනිසා පෙළඹෙන සැටි බෂාම් පැහැදිලි කරයි. එහෙත් යුද්ධය පිළිබඳ ආචාරධර්ම තිබීමේ හේතුව නිසා යුද්ධයේ කර්කශභාවය එක්තරා අන්දමකට ලිහිල් වන්නට ඇතැයි ඔහු විශ්වාස කරයි. එසේ වුවත් කවර හෝ ඉපැරණි ශිෂ්ටාචාරයක් විසින් යුක්තිය සහ කරුණාව මත පදනම් වන ආචාරධර්ම සහිත ව සංග්‍රාමයක හෝ සංග්‍රාමවල යෙදී ඇතැයි විශ්වාස කිරීමට ඔහු මැලි වෙයි.[18]

2.3 රාමායණය, ආචාරධර්ම රක්ෂණය හා උල්ලංඝනය.

දෙදෙනෙකු ඔවුනොවුන් හා යුද කරද්දී තෙවැන්නකු එතැනට මැදිහත් වී පහර දීම නොකළ යුතු ය. එහෙත් මේ ආචාරධර්මය උල්ලංඝනය කළ ආකාරය ගැන මහාභාරතය මෙන් ම රාමායණය ද නිදසුන් සපයයි.

රාමායණයේ සුග්‍රීව හා වාලින් යන දෙදෙනා අතර ඇතිවන ද්වන්ද්ව සටනට තෙවැන්නකු ලෙස මැදිහත් වන රාම සැඟවී සිට වාලින්ට පහර දී ඔහු මරා දමයි. මරණීය තුවාල ලැබ වැටී සිටින වාලින්ගේ ප්‍රකාශයෙන් අපට ආචාරධර්ම රැසක් මතු කොට ගත හැකි ය.

"ඔබ රජකුගේ පුතෙකි. ලොව ප්‍රචලිත ය. ප්‍රිය දැකුම් ඇත්තේය, මෙසේ සැඟවී සිට පහර දී ඔබ විසින් සිය ගුණය ගෙන යනු ලැබුවේ කොතැනකට ද ?[19]

එසේ ම වාලින් පවසන හැටියට කෙනකු යුද කළ යුත්තේ තමාට අපකාර කළ අය සමඟ යි. රාජ ධර්මය වූ කලී එය යි.

"පාර්ථිවානාං ගුණා රාජන් දණ්ඩශ්වාපාපකාරිෂු"[20]

වාලින් රාමට කිසි වරදක් කර නැත. තමාට වරදක් නොකළ අයට පහර දීම පිළිබඳ චෝදනාවට රාමායණ සංග්‍රාමයේ බොහෝ දෙනා මෙන් ම මහාභාරත සංග්‍රාමයේ බොහෝ දෙනා ද හසු වෙති. මේ අනුව රාමට සහාය වන සුග්‍රීව ප්‍රමුඛ සියලු වානරයෝ රාවණට එරෙහි ව අවි එසවීම නිසා ආචාරධර්ම උල්ලංඝනය කළෝ වෙති. එසේ ම මහාභාරත යුද්ධයේ දී දුර්යෝධනට සහාය වන භීෂ්ම, ද්‍රෝණ, කෘප, කර්ණ ආදි චරිතත් පංච පාණ්ඩවයන්ට ඇති හිතවත්කම උඩ ඔවුනට සහාය දෙන කෘෂ්ණ ඇතුළු පාණ්ඩව පක්ෂය ගත් චරිතත් මේ චෝදනාවට නිස්සෝ වෙති. එහෙත් යුක්තිය උදෙසා සටන් කරන්නන්ට සහාය වීම ආචාරධර්මයක් නම් සාධාරණ පක්ෂය ලෙස සැලකෙන පංච පාණ්ඩවයන් හා එක් වීමෙන් කෘෂ්ණ, දුර්යෝධනගේ සොයුරු යුයුත්සු වැනි චරිත

කොට ඇත්තේ ආචාරධර්ම රැකීම යි.

තව ද, වෙනත් දෘෂ්ටිකෝණයකින් මේ දෙස බලන විට දුර්යෝධන පක්ෂය ගැනීම ද ආචාරධර්ම රැකීමක් ලෙස කෙනකුට පෙනී යා හැකි ය. තමා සිය සේවය ලබා දීමට පිළිණ දුන් පක්ෂය හරි හෝ වැරදි වේවා ඔවුන් වෙනුවෙන් සටන් කිරීම ආචාරධර්මය නම් භීෂ්ම, ද්‍රෝණ, කෘප, කර්ණ ආදි රණශූරයන් විසින් කර ඇත්තේ ද ආචාරධර්ම රැකීම ය. මේ රණවිරුවෝ දුර්යෝධන වැරදි බව දනිති. එහෙත් ඔවුන් ප්‍රතිඥා කොට ඇත්තේ හස්තිනාපුරයේ පාලකයා වෙනුවෙන් සටන් කිරීමට යි. ඒ වන විට ධෘතරාෂ්ට්‍ර නාමික ව රජු ලෙස සිටියත් යුවරජු ලෙස හස්තිනාපුර රාජ්‍ය භාරය ඉසිලුවේ දුර්යෝධන යි. එහෙයින් ඔවුහු සිය මරණය සිදු වන තෙක් දුර්යෝධන වෙනුවෙන් සටන් කිරීම කළ යුතු ක්‍රියාව ලෙස සලකති. භීෂ්ම, ද්‍රෝණ, කර්ණ. මද්‍රි ආදීන්ගේ දුක්මුසු මරණ සාක්ෂි දරන්නේ ද ඔවුන් සිය ප්‍රතිඥාව ජීවිත පරිත්‍යාගයෙන් ම ඉෂ්ට කළ ආකාරයට යි.

මේ අන්දමින් මේ දෙස බලන විට සුග්‍රීව නම් වූ මිත්‍රයා වෙනුවෙන් ඉදිරිපත් වීමෙන් රාම විසින් කරන ලද්දේ නිවැරදි ක්‍රියාවකි. මෙහි වරද ඇත්තේ රාම මෙයට මුහුණ දුන් ආකාරය තුළ යි. රාම විසින් කළ යුතු ව තිබුණේ මිතුරා වෙනුවෙන් සෘජු ව ම වාලින්ට අභියෝග කොට ඔහු සමග සටනට මැදිහත් වීම ය.

තව ද වාලින් පවසන අන්දමට සටන් කළ යුත්තේ පෙනී පෙනී මිස සැඟ ව සිට නො වේ.

"දෘශ්‍යමානස්තු යුධ්‍යෙථා මයා යුධි නෘපාත්මජ[21]

ත්වයාදෘශ්‍යෙන තු රණෙ නිහතො'හං දූරාසදඃ"[22]

මේ අවස්ථාවට තරමක් දුරට සමාන සිදුවීමක් හෝමර්ගේ 'ඉලියඩ්හි' දක්නට ලැබේ. මෙනලව්ස් සිය කඳවුරේ සිටිය දී පැන්ඩරස් (Pandaros) නම් දුනුවායා සැඟ වී සිට හී එවා ඔහුට තුවාල සිදු කරයි.[23]

මෙසේ ඍජු ව ම යුද්ධමය කාර්යයට මැදිහත් වූවන් අතර ආචාරධර්ම රැකීම මෙන් ම නොරැකීම ද සිදු වෙයි. එහෙත් සූතයන් වෙත, අවි ගෙන යන්නන් වෙත, සක් වයන්නන් වෙත හෝ පහර දුන් බවකට රාමායණය හෝ මහාභාරතය සාධක නොසපයයි. සූතකාර්යය ඉෂ්ට කරන සංජය හෝ කෘෂ්ණ අනතුරුවලට ලක් නොවීම තව දුරටත් තහවුරු කරන්නේ ඉහත අප සඳහන් කළ කරුණ යි.

එමෙන් ම මෙසේ යුද කරන පක්ෂ දෙක උදෙසා ම පොදු සේවාවල නිරත වන අයගේ රැකවරණය සඳහා නූතන නීතිය ද පෙනී සිටින බව පෙනේ.

"... all the units and establishments of the medical service, whether mobile or fixed, and their personel and army chaplains, must be proctected and respected in all circumstances by the belligerent forces"[24]

තෘතීය පරිච්ඡේදය

යුද්ධ සීමා

3.1 යුද්ධාරම්භය සහ අවසානය

සූර්යෝදයෙන් පසු යුද ආරම්භ කළ යුතු ය. හිරු බැස ගිය පසු සටන් නතර කළ යුතු ය යන්න ඍජු ආචාරධර්මයක් ලෙස ඉදිරිපත් ව නොතිබුණ ද මහාභාරත යුද්ධය තුළ එවන් ප්‍රවණතාවක් තිබූ බවට මහාභාරතය බොහෝ නිදර්ශන සපයයි.

හිරු උදා වන තෙක් යුද්ධ කිරීම සඳහා බලා සිටි අවස්ථා ගැන මෙසේ කියැවෙයි.

"සූර්යොදයං න ඉච්ඡන්තඃ ස්ථිතා යුද්ධාය දංශිතාඃ[25]

සූර්යොදයේ මහාරාජ පුනර්යුද්ධාය දංශිතාඃ"[26]

මෙසේ හිරු උදාවෙන් මඳ වේලාවකට පසු ආරම්භ කැරෙන යුද්ධය සන්ධ්‍යාවේ හිරු බැස යන අවස්ථාවේ නතර කළ යුතු ය යන අදහස යුද වන් දෙපක්ෂය තුළ ම වූ බව පෙනේ.

යුද්ධයේ නවම දින සන්ධ්‍යාවෙහි යුධිෂ්ඨිර හිරු අවරට යනු දැක එදින යුද්ධය නතර කිරීමට තීරණය කරයි.

"නිශාමුඛං ච සම්ප්‍රෙක්ෂ්‍ය ඝොරරූපං භයානකම්
චින්තයිත්වා තතො රාජා අවහාරමරොචයත්"[27]

යථෝක්ත පද්‍යයේ යෙදුණු 'අවහාර' යන වචනය මහාභාරත යුද්ධය ගැන විස්තර වන පද්‍ය කොටස් ඇති ස්ථාන කිහිපයක දී ම අපට හමු විය. අවහාර යන්නෙන් අදහස් වන්නේ යුද්ධමය තත්ත්වයක් පවතිද්දී තාවකාලික ව යුද්ධය නතර කිරීම යි. මේ අවස්ථාව වර්තමානයේ භාවිත වන තාවකාලික සටන් විරාම අවස්ථාව සමග එක්තරා දුරකට සාම්‍යයක් පෙන්වයි. මහාභාරතයේ මේ වචනය යෙදීමේ විශේෂය වන්නේ එය සන්ධ්‍යා සටන් විරාම අවස්ථාවල දී ම යෙදී තිබීම යි. මෙය දෙපක්ෂය ම එක් වන් ව ගත් තීරණයක් බවට මහාභාරතීය ඇතැම් පද්‍ය සාක්ෂි දරයි.

"රජනීමුඛෙ සුරෞද්‍රෙ තු වර්තමානෙ මහාභයෙ

අවහාරං තතඃ කෘත්වා සහිතාඃ කුරුපාණ්ඩවාඃ
න්‍යවිශන්ත යථාකාලං ගත්වා ස්වශිබිරං තදා[28]

හිරු බැස ගිය පසු දෙපක්ෂයට ම අයත් පිරිස් තම-තමන්ගේ කුටිවලට යති. ඔවුහු අවි බැහැර කොට ප්‍රතිවාදීන් කෙරෙහි ගෞරවය පළ කරමින් වන්දි ගී අසමින් විවේකී ව ගත කරති. මේ අවස්ථාවේ යුද්ධය පිළිබඳ කතාවලට අවකාශ නොතැබූ බව ද පෙනේ.

"න හි යුද්ධකථාං කාංචිත් තත්‍රාකුර්වන් මහාරථාඃ"[29]

3.2 පහර නොදිය යුතු අවස්ථා සහ යුද නොවැදිය යුතු චරිත

මහාභාරතයේ එන භීෂ්මගේ පහත සඳහන් ප්‍රකාශය තුළ ද යුද්ධයේ ආචාරධර්ම ගැබ් වෙයි. එහි කියැවෙන හැටියට ආයුධ බහා තුබූ, වැටුණු, වියුක්ත සන්නාහ ධ්වජ ඇති, දුවන, බියපත් වූ, අභයදානය දෙන්නැ යි අයදින්නන් කෙරෙහි, එසේ ම ගැහැණුන් කෙරෙහි, ස්ත්‍රී ස්වභාව ඇත්තවුන් කෙරෙහි, විකල් වූවන් කෙරෙහි, එක දරුවකු ඇත්තකු කෙරෙහි, ප්‍රශස්ත නොවූ මිනිසකු කෙරෙහි යුද අවි හෙළීම භීෂ්මට රුචි නොවෙයි. එසේ ම අමංගල ධ්වජයන් දැක ද ඔහු යුද්ධ නොකරයි.

"නික්ෂිප්තශස්ත්‍රෙ පතිතෙ විමුක්තකවචධ්වජෙ

ද්‍රවමාණෙ ච භීතෙ ච තවාස්මීති වාදිනි
ස්ත්‍රියාං ස්ත්‍රීනාමධෙයෙ ච විකලෙ චෛකපුත්‍රකෙ

අප්‍රශස්තෙ නරෙ චෛව න යුද්ධං රොචතෙ මම

අමඞ්ගල්‍යධ්වජං දෘෂ්ට්වා න යුධ්‍යෙත කදාචන"[30]

එහෙත් මේ ආචාරධර්ම රැකීමේ ස්වභාවය ම භීෂ්මගේ විනාශය පිණිස හේතු වෙයි. ඔහු ගැහැණු ස්වභාවයෙන් යුතු චරිත සමග සටන් නොකරන බව දැන ගත්තා පාණ්ඩවයෝ ශිඛණ්ඩින් නම් නපුංසක චරිතය ඔහු ඉදිරියට එවති. එවිට භීෂ්ම ඔහු සමග සටන් නොකර හිඳියි. ඒ අවස්ථාවේ දී කෘෂ්ණගේ මෙහෙයවීම මත අර්ජුන ද නිරායුධ භීෂ්ම වෙත හී සර එවයි. මහාභාරතයේ ම සඳහන් වන අන්දමට ශිඛණ්ඩින් පෙරටු කොටගත් පංච පාණ්ඩවයෝ භීෂ්ම සැම පැත්තෙන් ම වටකොට හී පහර එවති.[31] මෙය ආචාරධර්ම සාහසික ලෙස උල්ලංඝනය කළ අවස්ථාවකට නිදසුන් කළ හැකි ය.

කෞරව පක්ෂය වෙනුවෙන් සටන් කරන ශල්‍ය රජු මුහුණ දෙන්නේ ද මේ ඛේදවාචකයට යි. එක් අවස්ථාවක දී ප්‍රබල රණකාමීන් රැගත් රථ සේනා ඔහු වට කොට පහර දෙයි.

"අභ්‍යධාවජ්ජිඝාංසන් වෛ ශල්‍යං මද්‍රාධිපං බලී
මහතා රථවංශෙන සමන්තාත් පරිවාරිතඃ"[32]

තමාට අවමන් කළ ද්‍රැපද රජුගෙන් පළිගැන්මට සිතන ද්‍රෝණාචාර්ය එරජු ජීවග්‍රාහයෙන් අල්වා තමාට ගුරුපූජා පවත්වන මෙන් සිය ශිෂ්‍යයන් වන කෞරව පාණ්ඩව දෙපිරිසට ම පවරයි. මෙහි දී සාර්ථකත්වය ලබන්නේ පාණ්ඩවයන් පස් දෙනා යි. ද්‍රැපද සේනා සමග සිදු කරන යුද්ධයේ දී ඔවුන් අතුරිනිදු භීම, බිහිසුණු ලෙස සටන් කරයි. ඒ මොහොතේ අර්ජුන පවසන්නේ ද්‍රැපද රජුගේ බල සෙනගට පීඩා නොකොට ගුරු පූජා පිණිස ද්‍රැපද පමණක් අල්වා ගත යුතු බව යි. එහෙත් භීම එයින් සෑහීමට පත් නොවී අකැමැත්තෙන් නතර වීමෙන් පෙනෙන්නේ

යුද්ධයෙහි ආචාරධර්ම පැවැති නමුදු ඒවා රැකීමේ අභිලාෂය ඔහු තුළ නොවූ බව ය.

"සම්බන්ධී කුරුවීරාණං ද්‍රුපදෝ රාජසත්තමඃ
මාවධීස්තද්බලං භීම ගුරුදානං ප්‍රදීයතාම්

භීමසෙනස්තදා රාජන්නර්ජුනෙන නිවාරිතඃ
අතෘප්තො යුද්ධධර්මෙෂු න්‍යවර්තත මහාබලඃ"[33]

කුන්තී දේවිය සහ කර්ණ අතර ඇතිවන සංවාදයෙන් ආචාරධර්ම මතුකොට ගත හැකි වෙයි. පංචපාණ්ඩවයන්ගේ මාතාව වන කුන්තී, සූර්ය දෙවියන් නිසා තමන්ට ලැබුණු සිය ජ්‍යෙෂ්ඨ පුත්‍ර කර්ණට පවසන්නේ යුද්ධයක දී ඥාති වධය නොකළ යුතු බව ය. එසේ ම සුහෘද්ජනයන් නැසීම පරාභවයට කරුණක් වන බව ය.

"ධිගස්ත්වර්ථං යත්කෘතෙ'යං මහාන් ඥාතිවධඃ කෘතඃ
වර්තස්‍යන්තෙ සුහෘදාං වෛ යුද්ධොස්‍යන් වෛ පරාභවඃ"[34]

තවත් අවස්ථාවක දී කියැවෙන්නේ නිර්ධන ව මිය යෑම ඥාතීන් මරා දමනවාට වඩා ශ්‍රේෂ්ඨ බව ය.

"අධනස්‍ය මෘතං ශ්‍රෙයො න හි ඥාතික්ෂයො ජයඃ"[35]

එසේ ම කුන්තී, ගුරුවරයා සමග යුද කිරීම ද හෙළා දකියි.

"නාචාර්යඃ කාමවාන් ශිෂ්‍යෛඃ ද්‍රොණෙ යුධ්‍යෙත ජාතුචිත්."[36]

එහෙත් මහාභාරත යුද්ධය තුළ මේ ආචාරධර්ම රැකෙන්නේ නැත. සහෝදරයෝ සහෝදරයන් සමගත් මාමා බෑනා සමගත් ශිෂ්‍යයා ගුරුවරයා සමගත් යුද කරති. අර්ජුන - කර්ණ යුද්ධය සහෝදරයන් අතර සිදු වන සටනකට ද භීම-දුර්යෝධන යුද්ධය ඥාති සහෝදරයන් අතර සිදු වන යුද්ධයකට ද අර්ජුන-ද්‍රෝණ යුද්ධය ශිෂ්‍යයා සහ ගුරුවරයා අතර ඇති වන යුද්ධයකට ද ශල්‍ය සහ යුධිෂ්ඨිර අතර ඇති වන යුද්ධය මාමා සහ බෑනා අතර ඇතිවන යුද්ධයකට ද නිදසුන් කළ හැකි ය.

සිව්වන පරිච්ඡේදය

4. යුද්ධය පිළිබඳ විවිධ ආකල්ප

4.1 යුද්ධය පිළිබඳ භගවද්ගීතා ආකල්පය.

කුන්තිට අනුව මෙබඳු යුද්ධ සිදු විය යුතු නොවේ. එහෙත් මේ සම්බන්ධයෙන් කෘෂ්ණගේ ආකල්පය මෙයට වෙනස් ය. මහාභාරතයේ භීෂ්ම පර්වයේ එන භගවද්ගීතාවේ අන්තර්ගත ඇතැම් පද්‍ය මේ සම්බන්ධයෙන් පැහැදිලි අදහස් ගෙන දෙයි. යුදබිමට පිවිසෙන අර්ජුන ප්‍රතිපක්ෂයෙහි සිටින සිය ඥාති සොහොයුරන් ප්‍රමුඛ නෑදෑයන්, ගුරුවරුන් හා හිත මිතුරන් දැක යුද කිරීමට මැලි වෙයි. ඔවුන් නැසීම අර්ජුන මහත් පාපයක් කොට සලකයි. ඔහුට එය ආචාරධර්ම උල්ලංඝනය කිරීමක් ද වෙයි. ඔහු පවසන්නේ පොළොව සඳහා නො ව මුළු තුන් ලොව ම ලැබුණත් ගුරු, නෑ, හිත මිතුරන් මැරිය නොහැකි බව ය.

"ආචාර්යාඃ පිතරඃ පුත්‍රාස්තථෛව ච පිතාමහාඃ
මාතුලාඃ ශ්වශුරාඃ පෞත්‍රාඃ ශ්‍යාලාඃ සම්බන්ධිනස්තථා

එතාන්න හන්තුමිච්ඡාමි ඝ්නතෝ'පි මධුසූදන
අපි ත්‍රෛලෝක්‍යරාජ්‍යස්‍ය හේතෝඃ කිං නු මහීකෘතේ"[37]

කෘෂ්ණ පවසන්නේ මෙයට ඉඳුරා ම වෙනස් අදහසකි. ඔහුට අනුව යුද්ධය ඇත්තේ යුක්තිය සහ අයුක්තිය අතර නම් යුක්තිය වෙනුවෙන් සටන් කළ යුතු ය. තමාට අතිශයින් සමීප ඥාතිවරයෙක් වේවා, ප්‍රිය මිතුරෙක් වේවා නියෝජනය කරන්නේ අසත් පක්ෂය

නම් ඔහුට විරුද්ධ ව සටන් කළ යුතු ය. එය ධර්මය යි; නිවැරදි ක්‍රියාව යි; ආචාරධර්මය යි. එහෙයින් ක්ෂත්‍රියකු විසින් මේ ධර්ම යුද්ධය අනිවාර්යයෙන් ම කළ යුතු ය.

"ධර්මයාද්ධි යුද්ධාච්ඡ්‍රෙයො'න්‍යත් ක්ෂත්‍රියස්‍ය න විද්‍යතෙ"[38]

පාපය වන්නේ මේ ධර්ම යුද්ධය නොකර සිටීම යි.

අථ චෙත්ත්වමිමං ධර්ම්‍යං සංග්‍රාමං න කරිෂ්‍යසි
තතං ස්වධර්මං කීර්තිං ච හිත්වා පාපමවාප්ස්‍යසි[39]

කෘෂ්ණ ප්‍රකාශ අනුව යමින් සිතන විට පෙනෙන්නේ යුක්තිය උදෙසා ගුරු, ශිෂ්‍ය, ඥාති, සුහෘත් ඈ කවරකු සමග හෝ වේවා යුද නොකර සිටීම පාපය වන බව යි.

කර්ණ සිය මව වන කුන්තීගේ ඉල්ලීම පරිදි අර්ජුන හැර සෙසු පාණ්ඩු පුත්‍රයන් නොනසන බවට ප්‍රතිඥා දෙයි. ඔහු යුධිෂ්ඨිර, භීම, නකුල සහ සහදේව පරාජය කොට මරා දැමීමට තමාට අවස්ථා ලැබුණ ද එසේ නොකොට සිය මවට දුන් ප්‍රතිඥාව ඉටු කරයි. එහෙත් ලැබුණු සෑම අවස්ථාවක දී ම මරණීය චේතනාවෙන් යුක්ත ව අර්ජුන සමග සටන් කරයි. අර්ජුන එක්තරා දුරකට වෛර චේතනාවකින් කර්ණ සමග සටන් කළ ද කර්ණ සටන් කරන්නේ අර්ජුන සිය සොහොයුරා බව දැන දැන ම තම පක්ෂය වෙනුවෙන් යුතුකම ඉෂ්ට කිරීම සඳහා ය. මේ අනුව අර්ජුන හැර අනෙක් පාණ්ඩු පුත්‍රයන් සතර දෙනා යුදබිමේ දී මරා-දැමීම ආචාරධර්ම උල්ලංඝනය කිරීමක් ලෙස සැලකුවා සේ ම අර්ජුන හා සටන් වැද ඔහු මරා නොදැමීම ද ආචරධර්ම උල්ලංඝනය කිරීමක් සේ ද ඔහු සැලකූ බව පෙනේ.

"වධ්‍යාන් විෂහ්‍යාන් සංග්‍රාමෙ න හනිෂ්‍යාමි තෙ සුතාන්
යුධිෂ්ඨිරං ච භීමං යමෞ චෛවාර්ජුනාදෘතෙ

අර්ජුනං හි නිහත්‍යාජෞ සම්ප්‍රාප්තං ස්‍යාත් ඵලං යථා"[40]

අර්ජුනගේ ඇතැම් ප්‍රකාශ තුළ ද ආචාරධර්ම ගැබ් වෙයි. තමන්ට රැකවරණය දුන් භීෂ්ම වැනි සිය ආදරණීය වැඩිහිටියන්

සමග සටන් කොට ඔවුන් මරා-දැමීම ඔහු වරදක් කොට සලකයි. භීෂ්මගේ උකුලේ වැඩුණු, සිය සුන්දර අතීතය සිහි කරන අර්ජුන එබඳු කෙනකු මරා දමන්නේ කෙසේ දැ යි කෘෂ්ණගෙන් ප්‍රශ්න කරයි. එසේ ම සිය සේනා විසින් තමා මරා-දමනු ලැබුව ද භීෂ්ම සමග සටන් නොකරන බව ඔහු පවසයි.[41]

"කාමං වධ්‍යතු සෛන්‍යං මෙ නාහං යොත්ස්‍යෙ මහාත්මනා"[42]

එසේ ම මෙය ධර්මයට පටහැණි නොවේ දැ යි අසන අර්ජුන බහා තුබු අවි ඇති වෘද්ධ වූ භීෂ්ම කෙරෙහි කෙසේ නම් අවි යැවිය හැකි දැ යි කෘෂ්ණගෙන් ප්‍රශ්න කරයි.

"කථමස්මද්විධඃ කෘෂ්ණ ජානන් ධර්ම සනාතනම්
න්‍යස්තශස්ත්‍රෙ ච වෘද්ධෙ ච ප්‍රහරෙද්ධි පිතාමහෙ"[43]

එහෙත් අර්ජුන විසින් සිය ආරක්ෂකයා, ගුරුවරයා, තමන් පියා සේ රැකබලා ගත් බව කියන භීෂ්ම මරා දැමිය යුතු ය යන්න දිගින් දිගට ම කෘෂ්ණ අවධාරණ කරයි.[44] මේ අනුව ආචාරධර්ම රකින මානසිකත්වයෙන් යුතු අර්ජුන ඒ තත්ත්වයෙන් වෙනස් කරන්නේ කෘෂ්ණ යැ යි කෙනෙකුට චෝදනා කළ හැකි ය. එහෙත් අසත් පක්ෂයේ පැවැත්ම දිගින් දිගට ම සහතික කරන්නේ භීෂ්ම බැවින් කෘෂ්ණ විසින් කරනු ලබන්නේ අර්ජුන, රැකිය යුතු ආචාරධර්මය වෙත කැඳවීම යැ යි තවත් කෙනකුට කල්පනා කළ හැකි ය.

"පාතෙයෙනං රථාත් පාර්ථ ක්ෂත්‍රියං යුද්ධදුර්මදම්
නාහත්වා යුධි ගාඞ්ගයං විජයස්තෙ භවිෂ්‍යති"[45]

අවසානයේ කෘෂ්ණගේ ඉල්ලීම නිවැරදි සේ සිතන අර්ජුන ඒ අනුව ක්‍රියා කිරීමට එකග වෙයි.[46]

මේ අවස්ථාව සංකීර්ණ ය. එහෙයින් මේ එක ම අවස්ථාව ඒ ඒ අය මේ දෙස බලන දෘෂ්ටිකෝණය අනුව ආචාරධර්ම රකින හෝ නොරකින අවස්ථාවකට නිදසුන් කළ හැකි ය.

4.2 යුද්ධය පිළිබඳ රාමායණ-මහාභාරත ආකල්පය

තමා අතින් ආචාරධර්ම උල්ලංඝනය වුව ද සත් පක්ෂය භජනය කරන පංච පාණ්ඩවයන් අතින් එසේ වෙති යි ප්‍රතිපක්ෂයෙහි සිටින දුර්යෝධන පවා විශ්වාස නොකරයි. භීම විසින් ආචාරධර්ම විරෝධී ලෙස, සිය කලවාවලට පහර දී බිම හෙළීම නිසා වේදනාවෙන් සිටින දුර්යෝධන යුද්ධයෙහි ලා පංච පාණ්ඩවයන් පෙළඹ වූ කෘෂ්ණට දොස් පවරයි. දුර්යෝධන කෘෂ්ණට ආමන්ත්‍රණය කරන්නේ දාසයකුට ආමන්ත්‍රණය කරන ආකාරයෙනි.[47] අනතුරුව ඔහු දිගින් දිගට ම කෘෂ්ණට දොස් පවරයි. පහත සඳහන් දුර්යෝධන ප්‍රකාශ අධ්‍යයනය කිරීමෙන් අපට යුද්ධයේ ආචාරධර්ම රැසක් මතුකොට ගත හැකි වෙයි.

"අධර්මෙණ ගදායුද්ධෙ යදහං විනිපාතිතඃ
උරූ භින්ධීති භීමස්‍ය ස්මෘතිං මිථ්‍යාප්‍රයච්ඡතා

ඝාතයිත්වා මහීපාලානෘජුයුද්ධාන් සහස්‍රශඃ

ශිඛණ්ඩිනං පුරස්කෘත්‍ය ඝාතිතස්තෙ පිතාමහඃ

ආචාර්යො න්‍යාසිතඃ ශස්ත්‍රං කිං තන්න විදිතං මයා
සා චානෙන නෘශංසෙන ධෘෂ්ටද්‍යුම්නෙන වීර්යවාන්"

පුනශ්ච පතිතෙ චක්‍රෙ ව්‍යසනාර්තඃ පරාජිතඃ
පාතිතඃ සමරෙ කර්ණශ්චක්‍රව්‍යග්‍රො'ග්‍රණීර්නෘණාම්

යදි මාං චාපි කර්ණං ච භීෂ්මද්‍රොණෞ ච සංයුතෞ

ඍජුනා ප්‍රතියුධ්‍යෙථා න තෙ ස්‍යාද් විජයො ධ්‍රැවම්
ත්වයා පුනරනාර්යෙණ ජිහ්මමාර්ගෙණං පාර්ථිවාඃ"[48]

ගදායුධවලින් කැරෙන සටනක දි කලවාවලට පහර නොදිය යුතු ය. එහෙත් භීම එය උල්ලංඝනය කරයි.

ඔවුනොවුන් සමග මුහුණට මුහුණ ලා ඍජු ලෙස යුද්ධ කිරීම ආචාරධර්මය යි. එහෙත් කෘෂ්ණගේ අනුශාසනා මත ඍජු නොවන යුද පිළිවෙත් අනුගමනය කොට පාණ්ඩව පක්ෂය විසින් බොහෝ රජවරු මරා-දැමෙති.

භීෂ්ම කිසිසේත් සමග යුද වැදීමට අකැමැති ශිඛණ්ඩින් පෙරටු කොට, අර්ජුන තෙවැන්නා ලෙස විත් නිරායුධ භීෂ්මට පහර දී ඔහු පරාජය කරයි. මෙය කලිනුදු අවස්ථාවක දී සඳහන් වුණු ආචාරධර්ම දෙකක් කැඩීමකි. ඒ නිරායුධ පුද්ගලයකුට පහර දීම සහ දෙදෙනකු අතර වන අර්බුදයකට තෙවැන්නකු ලෙස මැදිහත් වීම යි.

එසේ ම අන් අරමුණක සිත යොදා සිටි අවස්ථාවක ද්‍රෝණාචාර්ය මරණයට පත් කිරීමෙන් ද රථය එරුණු මොහොතේ කර්ණට පහර දීමෙන් ද පාණ්ඩව පක්ෂය විසින් කරන ලද්දේ ආචාරධර්ම උල්ලංඝනය කිරීම යි.

වංචනික මාර්ග අනුගමනය කොට ජයග්‍රහණය ලබා ගැන්ම ආචාරධර්මය නොවේ. දුර්යෝධන පවසන පරිදි පාණ්ඩවයන් සිය ජය සහතික කොට ගත්තේ කුටිල මාර්ග අනුගමනය කිරීමෙනි.

එහෙත් කෘෂ්ණට අවශ්‍ය වූයේ කෙසේ හෝ අසාධාරණයට පත් වූ පිළ ජයග්‍රහණය කර වීම යි. එහි දී අසාධාරණ පිළ පරාජය කිරීම සඳහා අසාධාරණ මාර්ගවලින් සටන් කිරීම ආචාරධර්ම උල්ලංඝනය කිරීමක් කොට කෘෂ්ණ නොසිතයි. ඔහුට අනුව අසාධාරණ පිළ වෙනුවෙන් ආචාරධර්ම රැකගනිමින් කරන යුද්ධය ද සාධාරණ නොවේ. මන්ද අසාධාරණ පක්ෂය උදෙසා යුද වැදීම ම ආචාරධර්ම උල්ලංඝනය කිරීමක් වන බැවිනි.

යුද්ධයේ ආචාරධර්ම සොයා යළිත් රාමායණය වෙත නැඹුරු වීම සුදුසු ය. මහාභාරතයේ මෙන් යුද්ධයේ ආචාරධර්ම ලෙස ඉදිරිපත් වන ඍජු ප්‍රකාශ රාමායණයෙන් මතු කොට ගැන්ම දුෂ්කර ය. එහෙත් මහාභාරතයේ සඳහන් වන ආචාරධර්ම රැකෙන සහ නොරැකෙන අවස්ථා සනිදර්ශන ව සාකච්ඡා කළ හැකි තැන් නම් රාමායණයේ දී කොතෙකුත් හමු වෙයි.

ගැහැණියකට පහර දීම වරදකි. යුද්ධ අපේක්ෂාවෙන් වුව තමා වෙත එළඹෙන ගැහැණියකට පහර දීම වරදක් කොට රාම සලකයි.

"න හ්‍යෙනාමුත්සහෙ හන්තුං ස්ත්‍රී ස්වභාවෙන රක්ෂිතාම්."[49]

එහෙත් කෘෂ්ණ අර්ජුනට උපදෙස් දුන් සෙයින් විශ්වාමිත්‍ර ඍෂිවරයා මුල දී ම රාමට පවසන්නේ බොහෝ දෙනකුට අපකාර කරන බිහිසුණු ගැහැණියක නැසීම වරදක් නොවන බව යි; චතුර් වර්ණයේ ම හිත සුව පිණිස කළ යුතු දෙය කළ යුතු බව යි; ක්‍රියාව මෘදු හෝ රුදු වේ වා පාපී දොස් සහිත වූවක් හෝ වේවා ප්‍රජා රක්ෂණය සඳහා එය කළ යුතු බව යි.

"න හි තෙ ස්ත්‍රීවධකෘතෙ ඝෘණා කාර්යා නරොත්තම
චාතුර්වර්ණ්‍යහිතාර්ථං හි කර්තව්‍යං රාජසූනුනා

නෘශංසමනෘශංසං වා ප්‍රජාරක්ෂණකාරණාත්
පාතකං වා සදොෂං වා කර්තව්‍යං රක්ෂතා සදා"[50]

කෘෂ්ණට අවනත වූ අර්ජුන සෙයින් ම රාම ද විශ්වාමිත්‍ර ඍෂිට අවනත ව තාටකා නම් වූ රකුසිය නසයි.[51]

ධාර්මික ජීවිත ගත කරන තවුස් උතුමන්ගේ ආගමික කටයුතු සුවසේ කරගෙන යාම පිණිසත් ඔවුන්ගේ ජීවිත රක්ෂණය සඳහාත් තවුසන්ට විරුද්ධ ව එන බලවේග සමග යුද වැදී ඔවුන් පලවා හැරීම හෝ මරා දැමීම රාම ආචාරධර්මයක් සේ සැලකූ බව පෙනේ.

"තපස්විනාං රණෙ ශත්‍රූන් හන්තුමිච්ඡාමි රාක්ෂසාන්"[52]

විශ්වාමිත්‍ර ඍෂි, පෙර ඉන්ද්‍ර විසින් පෘථිවිය කැමති වූ විරෝචන දියණියන් වූ මන්ථරාත් තවත් වරෙක විෂ්ණු විසින් පතිව්‍රතා ගුණයෙන් යුතු ලෝකය ලබා ගනු කැමැත්තෙන් සිටි භෘගු පත්නියත් ලෝකයේ යහපත උදෙසා මරා-දමනු ලැබූ බව කියා ස්ත්‍රීවධය සාධාරණීයකරණය කරයි.[53] ඇති වන ගැටුමක දී වුව ගැහැණියකට පහර දීම නුසුදුසු ය යන හැඟුම හනුමාන් තුළ

වෙයි. ලංකා රකුසියගෙන් පහර ලද හනුමාන් බැරි ම තැන ඇයට පහර දෙයි. ඇය බලවත් තැනැත්තියක වුව ද තමා ගැහැණියකට පහර දුන්නේ ය යන තැවුල හනුමාන් තුළ වෙයි.

"ස්ත්‍රී චෙත් මන්‍යමානෙන නාතික්‍රොධඃ ස්වයං කෘතඃ

තතස්තු හනුමාන් වීරස්තාං දෘෂ්ට්වා විනිපාතිතම්
කෘපාං චකාර තේජස්වී මන්‍යමානඃ ස්ත්‍රියං ච තාම්"[54]

ස්ත්‍රීවධ යනු ගැහැණියක මරා දැමීම පමණක් නො වේ. ඇයට කායික හෝ මානසික වශයෙන් පීඩා කිරීම ද ස්ත්‍රීවධයට අයත් ය. මේ අනුව බලහත්කාරයෙන් සීතාව පැහැර ගෙන ආ රාවණ මේ චෝදනාවට ලක් කළ යුතු වෙයි. සීතා හඬද්දී, වැලපෙද්දී රාවණ ඇය පැහැරගෙන ගිය බව රාමායණයේ සඳහන් වෙයි.[55] එසේ ම සීතා ආදරය කරන රාම ජීවත් ව සිටිය දී තමා හා විවාහ වන්නැ යි රාවණ කළ ඉල්ලීම ද සීතාවට මහත් මානසික පීඩාවක් වූ බව පෙනේ.[56] මේ සිදුවීම හින්දු ධර්මශාස්ත්‍ර ග්‍රන්ථවල විවාහ ක්‍රම ගැන සඳහන් වන ප්‍රකාශවලට අනුව රාක්ෂස විවාහයක් සඳහා දැරූ ප්‍රයත්නයකි. ගැහැණියක් හඬද්දී වැලපෙද්දී බලයෙන් පැහැරගෙන ගොස් ඇය විවාහ කරගැන්මට කටයුතු කිරීම රාක්ෂස විවාහයකැ යි මනුස්මෘතිය කියයි.

"හත්වා ජිත්වා ච හිත්වා ච ක්‍රොශන්තීං රුදතීං ගෘහාත්
ප්‍රසහ්‍ය කන්‍යාහරණං රාක්ෂසො විධිරුච්‍යතෙ"[57]

එහෙත් මේ ක්‍රියාව සිදු වන්නේ ක්ෂත්‍රියයකු අතින් නම් එය වරදක් සේ නොසැලකිය යුතු බව මනුස්මෘතිය ම සඳහන් කරයි.[58] ඒ අනුව රාජ වංශය නියෝජනය කරන රාවණ ද හින්දු සම්ප්‍රදායානුගත ඉගැන්වීම්වලට අනුව නම් යට කී චෝදනාවෙන් නිදහස ලබයි. එහෙත් වර්තමාන නීතිය ස්ත්‍රීහරණය වරදක් ලෙස සලකා ඊට සම්පූර්ණ වාරණයක් පණවයි. ඒ අනුව කවර හෝ වයස් මට්ටමක සිටින දැරියක, යුවතියක හෝ ගැහැණියක ඇගේ අකැමැත්ත පළ කරද්දී බලයෙන් පැහැරගෙන යාම දඬුවම් ලැබිය යුතු වරදකි.

"Whoever takes away or detains any woman, of whatever age, against her will by force with the intention that she may be known by himself or anyone else, is guilty of and offence".[59]

මේ අනුව, නූතන නීති යටතේ සීතාහරණය කළ රාමායණයේ රාවණ ද ද්‍රෞපදීහරණය කළ මහාභාරතයේ ජයද්‍රථ ද දඬුවම් ලැබිය යුත්තෝ වෙති.

4.3 දූතයන් පිළිබඳ ආකල්පය

රාමායණයේ දී දූතවධය ප්‍රතික්ෂිප්ත ය. රාම විසින් දූතයන්ට හෝ චරපුරුෂයන්ට හෝ වධ දුන් අවස්ථා නොපෙනේ. රාවණ ද දූතයන්ට වධ දුන් බවක් නොපෙනේ. එහෙත් දූත වේශයෙන් ආ චරපුරුෂයන් නම් රාවණගේ නිර්දය දඬුවම්වලට ලක් වූ බව පෙනේ.

රාමායණය පැහැදිලි ලෙස ම දූතවධය හෙළා-දකියි. මේ සම්බන්ධයෙන් අවස්ථා කීපයක් ම නිදසුන් කළ හැකි ය.

"දූතවධ්‍යා න දෘෂ්ටා හි රාජශාස්ත්‍රෙෂු රාක්ෂස,"[60]

"න දූතවධ්‍යාං ප්‍රවදන්ති සන්තඃ"[61]

"න දූතො වධමර්හති[62]

දූතවධ්‍යා විගර්හිතා"[63]

සීතා සොයා ලංකාවට පැමිණි හනුමාන් රාවණ ග්‍රහණයට හසු වෙයි. රාවණ, ඔහුට දඬුවම් දීමට සැරසුණු මොහොතේ විභීෂණ ප්‍රමුඛ ඇතැම් දෙනා ඉහත සඳහන් පරිදි දූතවධයේ වරද පෙන්වා දෙති. ඔවුන්ගේ බස් නොඅසන රාවණ, හනුමාන්ට දඬුවම් දෙයි. මෙහි දී රාවණ දූතවධය කොට ආචාරධර්ම උල්ලංඝනය කෙළේ යැ යි අපට චෝදනා කළ නොහැක්කේ සැබැවින් ම හනුමාන් පැමිණියේ දූත ගමනක් නොවන බැවිනි. ඔහුගේ ක්‍රියා කලාපය බොහෝ දුරට චරපුරුෂයකුගේ ක්‍රියා කලාපය සමග

සැසඳෙයි. එහෙයින් චරපුරුෂයකුට දිය යුතු දඬුවම දූත් රාවණ, ආචාරධර්ම උල්ලංඝනය කළ තැනැත්තකු සේ සැලකීම සාවද්‍ය සේ කෙනෙකුට පෙනී යා හැකි ය.

නූතන යුද නීතියට අනුව චරපුරුෂයකුට මූලික පරීක්ෂණයකින් පසු වරදකරු බව හෙළි වුවහොත් දඬුවම් දිය හැකි ය. රාමායණය ම සඳහන් කරන අන්දමට රාවණ, හනුමාන්ට දඬුවම් නියම කරන්නේ වගකිවයුතු පිරිසක් ඉදිරියේ ප්‍රශ්න කිරීමෙන් පසුව ය. මේ ප්‍රශ්න කිරීම පහත සඳහන් නූතන නීති තත්ත්වය හා සැසඳිය හැකි සේ පෙනේ.

"A spy,even when taken in the act, must not be punished without previous trial"[64]

වරද සිදුකොට ඇත්තේ රාම දූතයා වන හනුමාන් විසිනි. ඔහු රාවණගේ රාජ්‍යයේ බොහෝ දෙනාට හානි කරයි. වර්තමාන නීතිවලට අනුවත් සතුරකුගේ වේ වා පෞද්ගලික දේපළට හානි කිරීම වරදකි. යුදමය අවස්ථාවල දී ආරක්ෂා හමුදාවනට අයත් අය විසිනුදු කළ යුත්තේ පෞද්ගලික දේපළ ආරක්ෂා කිරීම මිස ඒවා විනාශ කිරීම නොවේ.

"The destruction of seizure of enemy property is forbidden,..........."[65]

"Private property must be respected,"[66]

එපමණක් නො ව වර්තමාන නෛතික තත්ත්වවලට අනුවත් හනුමාන් විසින් කර ඇත්තේ උදර්පණ නීතිය යටතේ දඬුවම් ලබා දිය හැකි වරදකි.

"උදර්පණය යනු අන්තර්ජාතික නීති බැඳීම් අනුව රක්ෂස්ථාන දෙන රාජ්‍යය විසින් ඉල්ලුම් කරන රාජ්‍ය වෙත අපරාධකරුවකු යැවීමේ නීතිමය ක්‍රියා කලාපය යි."[67]

උදර්පණීය වැරදි පිළිබඳ විස්තර වන ලේඛනයට අනුව මිනීමැරීම, අපරීක්ෂාකාරී හෝ නොසැලකිලිමත් ක්‍රියාවක්

කිරීමෙන් මරණය සිදු කිරීම, ගින්නෙන් අනර්ථය සිදු කිරීම, ගෙවල් බිඳීම හෝ ගෙවල්වලට අයුතු ලෙස ඇතුළුවීම දඬුවම් ලැබිය යුතු වැරදි වේ.[68]

හනුමාන් යට කී පරිදි ලංකා පුරයේ මන්දිර දවා ජීවිත විනාශ කරයි. එසේ ම අනවසරයෙන් රහසිගත ව රාවණගේ අන්තඃපුරයට ඇතුළු වී නිවෙස්වලට අයුතු ලෙස ඇතුළු වීමේ වරද සිදු කරයි. මේ වැරදි සිදු කෙළේ වර්තමානයේ දී නම් හනුමාන් පෙරළා සිය රටට පලා ගියත් ගැළවීමක් නැත. මන්ද ඔහු කළ වැරදි අනුව සිය රට ගියත් රාම විසින් ඔහු රාවණ වෙත එවීමට උදර්පණීය නීතිය යටතේ බැඳී සිටින බැවිනි.

රාවණගෙන් දඬුවම් ලැබීමෙන් කුපිත වන හනුමාන් යට කී පරිදි ලංකා පුරයේ බොහෝ මන්දිර ගිනි තබා විනාශ කරයි. රාවණපුත්‍ර ඉන්ද්‍රජිත්ගේ මෙන් ම ශුක සහ සාරණ යන රකුසන් දෙදෙනාගේ මන්දිර ද මේ අතර වෙයි.[69] පසුව රාම සේනාවෙහි තොරතුරු සොයා ගෙන ඒම සඳහා රාවණ විසින් යොදවනු ලබන්නේ ද මේ දෙදෙනා යි. මෙසේ රාම පාක්ෂිකයකුගෙන් පීඩා ලද චරිත දෙකක් රාම රහස් සෙවීම සඳහා යෙදවීම රාවණගේ බුද්ධිමත් භාවයට සාක්ෂි දරයි. තමා ලද පීඩා නිසා ම ඔවුන් වැඩි උනන්දුවකින් මේ සඳහා නිරත විය හැකි ය. එසේ ම මෙහි දී රාවණ කරන්නේ වරදක් ද නො වේ. මන්ද, දෙපිරිසක් අතර ගැටුමක් පවතිද්දී චරපුරුෂ සේවය මගින් ඔවුනොවුන්ගේ රහස් සෙවීම වරදක් නොවන බැවිනි.

නූතන නෛතික තත්ත්ව යටතේ ආක්‍රමණකාරී සෑම යුද්ධයක් ම අන්තර්ජාතික නීතියට පටහැනි වෙයි. ඊට අනුව අන්තර්ජාතීය ආරවුල් නිරවුල් කිරීම සාමකාමී මාර්ගයන්ගෙන් පමණක් සිදු විය යුතු ය.[70]

පඤ්චම පරිච්ඡේදය

නිගමනය

යටකී අදහස් පාදක කොට ගනිමින් රාම-රාවණ යුද්ධය දෙස බලන විට රාමගේ ක්‍රියා කලාපය නීතිවිරෝධී බව පෙනීයයි. ඔහු ස්වාධීන රාජ්‍යයකට බලයෙන් ඇතුළු වෙයි. එහි රාජ්‍ය පාලකයා වන රාවණ පරාජය කොට මරා-දමයි. ඉන් නොනැවතී තමාට අවනත විභීෂණ නමැති රාවණගේ සොහොයුරාට රාජ්‍යය පවරා-දෙයි. මෙහි දී විභීෂණ ක්‍රියා කරන්නේ රාමට යටත් රාජ්‍යයක පාලකයා ලෙස යි. රාමගේ මෙම ක්‍රියා කලාපය තුළ මෙසේ පැහැදිලි ව ම ආචාරධර්ම උල්ලංඝනය කිරීමේ තත්ත්වයක් තිබුණ ද රාවණ විසින් සීතා පැහැර ගැන්ම නම් වූ ප්‍රබල හේතුව ම රාමට ලෝකයා ඉදිරියේ නිර්දෝෂී පුද්ගලයකු ලෙස පෙනී-සිටීමට උපකාර කරයි.

පොදු යහපත හැරුණු විට අන් කිසි විටෙක සන්නද්ධ බලය භාවිත කළ යුතු නො වේ.[71] එහෙත් රාම සිය සන්නද්ධ බලය භාවිත කෙළේ රාවණගෙන් පීඩිත ලංකා රාජ්‍යය මුදාගෙන ඒ රටේ ජනතාව සුඛිත මුදිත කිරීමේ අභිලාෂයෙන් නොවේ. රාමායණයට අනුව ලංකාපුර ජනතාව රාවණ පාලනය යටතේ සතුටින් සිටි බව පෙනේ. එබඳු රාජ්‍යයක පාලකයාට එරෙහි ව රාම සිය සන්නද්ධ බලය යොදවන්නේ පොදු අරමුණක් සඳහා නොව සිය බිරිඳ සීතා මුදවා-ගැන්ම නම් වූ පෞද්ගලික අරමුණ

මුදුන් පත් කර ගැන්ම සඳහා ය. මේ අනුව රාමගේ මැදිහත් වීම පෞද්ගලික අරමුණක් උදෙසා පොදුවේ රාජ්‍යය සතු සන්නද්ධ බලය යොදාගැනීමකැ යි කෙනෙකුට චෝදනා කළ හැකි ය.

එහෙත් යුක්තිසහගත සහ යුක්තිසහගත නොවන යුද්ධ[72] යනුවෙන් කැරෙන වර්ගීකරණයක දී රාමගේ ක්‍රියා කලාපය ඒ දෙකට ම අයත් කළ හැකි බව පෙනේ.

රාවණ විසින් සිය බිරිඳ පැහැරගෙන යනු ලැබීම නිසා රාම, රාවණ සමග යුද්ධයට එළඹීම සාධාරණ ඉදිරිපත් වීමක් ලෙස සැලකිය හැකි ය. එහෙත් වාලින් සහ සුග්‍රීව අතර සිදු වන යුද්ධයේ දී රාම නෙවැන්නා ලෙස ඊට මැදිහත් ව සැඟවී පහර දී වාලින් මරා දැමීම අසාධාරණ යුද්ධයක් ලෙස නම් කළ හැකි ය.

අතීතයේ පැවැතියාට වඩා වර්තමාන යුද්ධය තුළ බිහිසුණු මුහුණුවරක් පවතී. එක් පුද්ගලයකු විසින් කරනු ලබන ආචාර-ධර්ම උල්ලංඝනය නිසා අතීතයේ දී සිදු වූයේ එක් ජීවිතයක හෝ ජීවිත කිහිපයක විනාශය විය හැකි ය. එහෙත් ඉතා දියුණු අවි ආයුධ පවතින නූතන සමාජය තුළ එබඳු එක් වරදක් නිසා විශාල ජීවිත විනාශයක් සිදු විය හැකි ය. එහෙයින් යුද නොකොට බැරි ම තත්ත්වයක් පවතී නම් අද සිදු විය යුත්තේ එදාටත් වඩා ආචාරධර්ම සහිත ව කැරෙන යුද්ධයකි. ජන ජීවිතයට බාධා නොකොට, කලාශිල්පයනට හානි නොකොට කළ අතීත යුද්ධය පිළිබඳ ව නූතන යුද්ධ පිළිබඳ අමිහිරි අත්දැකීම් ලබන ලෝකයක ජීවත් වූ විසිවන සියවසේ විද්‍යාර්ථීන්ගේ අවධානය මෙසේ යොමු වූයේ ද ඒ නිසා විය හැකි ය.

"We must specially emphasize this social aspect of war. In modern war the normal course of individual and commercial life is greatly disturbed. Trade is hampered and prices rise enormusly. In a word, non-combatants are as much affected as combatants. This stands in contrast with the theory and practice of war in ancient India. The normal life of the people was never disturbed and arts and crafts continued to flourish irrespective of war or peace."[73]

එහෙත් සාමාන්‍ය ජන ජීවිතයට බාධා නොවන පරිදි යුද කිරීම අද ප්‍රායෝගික වශයෙන් කළ හැකි දෙයක් නොවේ. එහෙයින් කළ යුත්තේ කොන්දේසි විරහිත ව අවංක ව සියලු පාර්ශ්වයන් විසින් යුද්ධය අත්හැරීම මිස යුද කිරීම නොවේ. මෙය පහසු කටයුත්තක් නොවේ. මන්ද අවි අත්හරින බවට ප්‍රතිඥා දී එසේ නොකොට, තමන් ගැටෙන්නට අදහස් කරන පිරිස දුර්වල වන තැන් බලා අනපේක්ෂිත ව පහර දීමේ අවස්ථා නූතන සමාජය තුළ සිදු වන බැවිනි. කෞටිලීය අර්ථශාස්ත්‍රය වැනි සංස්කෘත ග්‍රන්ථයකින් එබඳු කූට යුද්ධයකට අනුබල ලැබුණත් ධර්ම යුද්ධය අගයන සංස්කෘත වීරකාව්‍යවලින් ඊට අනුබල නොලැබෙන බව ද මෙහි දී සඳහන් කළ යුතු වෙයි.

මෙසේ රාමායණ යුද්ධයත් මහාභාරත යුද්ධයත් දෙස පරීක්ෂාකාරී ව බැලීමේ දී අපට යුද්ධය තුළ තුබූ ආචාරධර්ම රැසක් හඳුනාගත හැකි විය. එසේ ම ඒ ආචාරධර්ම රැකුණු සහ නොරැකුණු අවස්ථා පිළිබඳ ව අපට සනිදර්ශන ව සාකච්ඡා කළ හැකි විය.

මේ යුද්ධ ද්වයේ ම මුල් දිනවල ආචාරධර්ම රැකීමේ ස්වභාවයක් පැවති බව පෙනේ. එහෙත් යුද්ධය වූ කලී මානුෂික ස්වභාව ඉක්මවා පවත්නා අමානුෂික තත්ත්වයකි. එහෙයින් අමානුෂික ස්වභාවයක් මානුෂික ස්වභාව යටතේ පැවතිය නොහැකි ය යන අදහස සනාථ කරවමින් දිගින් දිගට ම ආචාර-ධර්ම උල්ලංඝනය වෙයි. ආචාරධර්ම රැකීම සඳහා පිළිණ දුන් චරිත ම යුදබිමේ දී ඒවා කඩ කරති.

මෙයින් තහවුරු වන්නේ යුදබිමක ආචාරධර්ම රැකීමට කථා කිරීම නිෂ්ඵල බව ය. මන්ද එබඳු ආචාරධර්ම හදවතින් ම රැකීමේ ස්වභාවයක් මනුෂ්‍යයන් තුළ පවත්නේ නම් යුද්ධයක් ඇති නොවන බැවිනි.

ආචාරධර්ම සහිත ව යුදබිමට පිවිසි රණශූරයෝ සිය සමීපතමයන්ගේ ශෝකජනක අභාවයන් යුදබිමේ දී අත්දැකීමෙන් පසු ප්‍රචණ්ඩ වෙති.

සිය පුත් අභිමන්‍යුගේ මරණයෙන් පසු අර්ජුනත් පුත් ඝටෝත්කචගේ මරණයෙන් පසු භීමත් සොයුරු දුශ්ශාසනගේ

සහ මිතුරු කර්ණගේ අභාවයෙන් පසු දුර්යෝධනත් ප්‍රචණ්ඩ වීම මෙයට මහාභාරතයෙන් දිය හැකි නිදර්ශන යි.

තාඩකා රකුසියගේ මරණයෙන් පසු ඇයගේ පුත් මාරිචත් සිය සහෝදර දූෂණ රකුසාගේ මරණයෙන් පසු බරත් සිය පුත් මේඝනාදගේ සහ සහෝදර කුම්භකර්ණගේ මරණයෙන් පසු රාවණත් ප්‍රචණ්ඩ වීම මේ සඳහා දිය හැකි රාමායණීය නිදර්ශන යි.

රාමායණ-මහාභාරත යුද්ධ ද්වය නිසා සිදු වූ මහා ජීවිත විනාශය දෙස බලන විට ලද ජය කුමක් ද යන හැඟුම කෙනෙකු තුළ ඇති විය හැකි ය. ජීවිතය පිළිබඳ සත්‍යය නම් ජීවිතයේ පැවැත්ම යි. යුද්ධය විසින් කර ඇත්තේ මේ පැවැත්ම නතර කර දැමීම යි. රාමායණ යුද්ධයේ දී රාම පිළ ජයග්‍රහණය කළ ද ඔහු තුළ සතුටක් නුවූ බව පෙනේ. ඔහුට යළි තමා දිනාගත් සීතා සමග හෝ යහපත් යුග ජීවිතයක් ගත කිරීමට නොලැබේ. සීතාව ලබා ගැන්ම නම් වූ ලෞකික පරමාර්ථය උදෙසා අපමණ ජනතාවකගේ ජීවිත විනාශය සිදු කළ යුද්ධයකට මැදිහත් වූ රාම ඒ දිනාගත් සීතාව ගැබිණියක ව සිටින මොහොතක අත් හැර දමයි. එහෙයින් එබඳු චරිතාංග ඇති තැනැත්තකු විසින් වාලින්ට සැඟවී පහර දීම හෝ ශක්‍රසාරථී මාතලින්ගේ සහාය ඇති ව රාවණට පහර දීම හෝ පුදුමයක් නොවේ. කෙසේ වෙතත් රාමායණ යුද්ධය සම්බන්ධයෙන් අපට එළඹිය හැකි සත්‍යයට සමීප නිගමනය වන්නේ රාම හෝ රාවණ යන දෙදෙනා ම ජයග්‍රහණය නොකළ බව යි.

මහාභාරත මහා සංග්‍රාමය අවසන් වන්නේ පරාජිත පිළට තිදෙනෙක් ද ජයග්‍රාහක යැ යි සම්මත පිළට සත්දෙනෙක් ද ශේෂ කොට තබමිනි. ජයග්‍රාහක පිළට සිය ජයග්‍රහණය ගැන උදම් අනන්නට තරම් වත් ප්‍රමාණවත් පිරිසක් නැත. මහාභාරතයේ වරින් වර විස්තර වන උදාර ගුණ සහිත චරිත මේ යුද්ධය නිසා අහිමි වෙයි. එහෙයින් යුද්ධයේ ආචාරධර්ම පිළිබඳ ව කැරුණු මෙම සාකච්ඡාවේ දී අපට පෙනී ගියේ යුද බිම තුළ ආචාර-ධර්ම නොරැකෙන බව ය. එසේ ම යුද්ධය නිරර්ථක, බිහිසුණු මෙන් ම සංවේගජනක ප්‍රතිඵල උදා කරවන්නක් ය යන්න මේ සම්බන්ධයෙන් අවසානයේ දී අපට එළඹිය හැකි වඩාත් ප්‍රඥාගෝචර නිගමනය යි.

පාදක සටහන්

1. මහාභාරතය vi.1.27-34

   මහාභාරතය පර්ව හෙවත් ප්‍රධාන කොටස් දහඅටකින් යුක්ත යි. මෙහි දී VI යන්නෙන් අදහස් වන්නේ මහාභාරතයේ හය වන පර්වය වන භීෂ්ම පර්වය යි. I යන්නෙන් අදහස් වන්නේ එම පර්වයේ ප්‍රථම සර්ගය යි. 27-34 යනු එහි අදාළ පද්‍ය අංක යි. ඉදිරියේ දී මහාභාරතීය මූලාශ්‍රය සටහන් දමනු ලබන්නේ මේ ආකාරයට යි. එනම් පළමු ව පර්වය ද දෙවනු ව අධ්‍යාය ද තෙවනු ව අදාළ පද්‍ය හෝ පද්‍ය ද ආදි වශයෙනි.

   ශ්‍රීමන්මහාභාරතම් (මූලමාත්‍රම්) ප්‍රකාඃ ඝනශ්‍යාමදාස i-iv, ගීතා ප්‍රෙස්, ගොරඛපූර්, 1956 - 1958.

2. න ච හන්‍යාත්ස්ථලාරූඪං න ක්ලීබං න කෘතාඤ්ජලිම්
   න මුක්තකෙශං නාසීනං න තවාස්මීති වාදිනම්

   න සුප්තං න විසන්නාහං න නග්නං න නිරායුධම්
   නායුධ්‍යමානං පශ්‍යන්තං න පරෙණ සමාගතම්

   නායුධව්‍යසනප්‍රාප්තං නාර්තං නාතිපරික්ෂතම්
   න භීතං න පරාවෘත්තං සතාං ධර්මමනුස්මරන්

   මනුස්මෘති vii. 91-93

   මනුස්මෘතිඃ සංස්ඃ නාරායණ රාම, බොම්බාය, 1946,263,294 වන පිටු.

3. Members of the armed forces and other persons mentioned in the following Article, who are wounded or sick, shall be respected and protected in all circumstances.

   They shall be treated humanely and cared for by the Party to the conflict in whose power they may be, without any adverse distintion founded on sex, race, nationality, religion,

political opinions, or any other similar criteria. Any attempts upon their lives, or violence to their persons, shall be srictly prohibited; in particular, they shall not be murdered or exterminated, subjected to torture or to biological experiments; they shall not wilfully be left without medical assistance and care, nor shall conditions exposing them to contagion or infection be created."

U.N.T. S.No. 970 VOL. 75, 1950, Article 12, page 5.

මේ ජිනීවා සංශෝධිත සම්මුතියෙන් උපුටා ගැනුණු පාඨයකි. මෙම සම්මුතිය 1929 ජූලි 27 වන දින මුල්වරට පැනවිණ. විවිධ රටවල තානාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් 1949 අප්‍රියෙල් 21 සිට අගෝස්තු 12 දක්වා ජිනීවා නුවර දී ම පැවැති සමුළුවක දී මෙම සම්මුතිය සංශෝධනය කර නැවත නිකුත් කැරිණි.

4. මහාභාරතය, ix. 33.50 .

5. එම ix. 33.52.

6. එම vi. 58.19.

7. එම vi. 58.83.

8. එම vi. 75.26.

9. එම vi. 118.2,3.

10. එම viii.90.111-113.

11. එම vii.192.47-52, 62, 63, 69.

12. The complete works of Homer - The Iliad & The Odessy; Translated by Andrew Lang, Waltre Leaf, Ernest Myers & S,H. Bueher, New York, 1950, pp 102, 103.

13. Op.cit;page 180.

14. "Take us alive, O son of Atreus, and receive worthy ransom,...

So did the twain weeping beseech the king with soft words, but they heard a voice wherein there was no softness at all:

......

He spake and dashed Peisandros from his chariot to the earth, smiting him with the spear upon the breast, and he lay supine on the ground. But Hippolochos rushed away, and him too he smote to earth, and cut off his arms and his neck with the sword, then tossed him like a bull of stone to roll through the throng......

Op.cit; page 189.

15. Manual of Military Law; edited by G. A. R. Fitzgerald & Others, War Office, Printed under the Authority of HisMajesty's Stationery office by Harrison and son,s London, 1914, page 244.

16. මහාභාරතය vi.45.84.

17. එම: ii.24.7.

18. These rules were not always kept. The heroes of the Mahabharata infringe them many times, event at the behest of their mentor Krsna, and the infringements are explained and pardoned by recourse to casuistical arguments of expediency and necessity.

The rules of war could only be maintained strictly by a king certain of victory or certain of defeat. Where chances were narrow the claims of self-preservation inevitably made themselves felt. But the chivalrous rules of warfare, probably on very old tradition, and codified in their present form among the martial peoples of Western India in post-Mauryan times, must have had some effect in mitigating the harshness of war for combatant and non-combatant alike. It is doubtful if any other ancient civilization set such humane Ideals of warfare."

Basham; A.L. : The Wonder that was India,

(Third revised edition) London, 1985, page 126.

19. රාමායණය iii.17.16.

    රාමායණය කාණ්ඩ හතකින් යුක්ත යි. මෙහි දී iii යන්නෙන් අදහස් වන්නේ රාමායණයේ තෙවන කාණ්ඩය වන කිෂ්කින්ධා කාණ්ඩය යි. 24 යනු එම කාණ්ඩයේ 24 වන සර්ගය යි. 16 යනු අදාළ පද්‍යය යි. ඉදිරියේ දී රාමායණ මූලාශ්‍රය සටහන් දමනු ලබන්නේ මේ ආකාරයට යි. එනම් පළමු ව කාණ්ඩය ද දෙවනු ව සර්ගය ද තෙවනු ව අදාළ පද්‍යය ද ආදි වශයෙනි.

    ශ්‍රීමද්වාල්මීකිරාමායණම් (මූලමාත්‍රම්) සංස් ; රාමනාරායණදත්ත ශාස්ත්‍රී, ගොරඛපුර,1963.

20. එම, iii.17.19.
21. එම, iii.17.47.
22. එම, iii.17.48.
23. The Iliad & The Odyssey:Tran: by Andrew Lang & others, New York, 1950, page 52.
24. Manual of Military Law, London, 1914, page 262.
25. මහාභාරතය, vi.50.58.
26. එම. vi.75.13.
27. එම. vi.107.4.
28. එම. vi.96.80.
29. එම. vi.86.56.
30. එම. vi.107.77-80.
31. එම. vi.119.1.
32. එම. vi.47.45.
33. එම. I.137.61,62.
34. එම. vi.144.11.
35. එම. v. 144.13.
36. එම. v. 144.15.

37. එම. vi. 25.34,35 සහ භගවද්ගීතා I.34,35 Aurobindo, Sri.: Essays On the Gita, (With Sanskrit Text and Translation of the Gita) Pondicherry, 1972, page 585 .

38. එම. vi.26.31 සහ භගවද්ගීතා ii.31, Essays On the Gita, page 594.

39. vi.26.33 සහ භගවද්ගීතා ii.33, Essays On the Gita, page 597.

40. එම. v.146.21, 22.

41. එම. vi.109.93.

42. එම. vi.109.95.

43. එම. vi.109.95 සහ 96 අතර ඇති අංකයක් සඳහන් නොවන පද්‍යය.

44. එම. vi.109.96.

45. එම. vi.109.97.

46. එම. vi.109.103, 104.

47. එම. ix. 61.27.

48. එම. ix. 61.28,29,31,32,36-39.

49. රාමායණය, i.26.12.

50. එම. i.25.17,18.

51. එම. i.26.26.

52. එම. iii.6.25.

53. එම. i.25.20-22.

54. එම. v.3.41,42.

55. එම. III.49.23,37.
III.52. 5-8,13,42.
III.53.2,25,26.
III.54.5,6.

56. එම. III.47.28,31-44.

57. මනුස්මෘති (නාගරී) III.33, සංස්.: ප්‍රාණජීවන ශර්මන්, බොම්බාය, 1913,92 වන පිටුව.

58. එම. III.23,24,26.

59. Manual of Military Law,London,1914, page 96.

60. රාමායණය. v.58.149.

61. එම. v.52.14.

62. එම. v.52.21.

63. එම. v.53.2.

64. Manual of Military Law,London,1914,page 260.

65. Op. cit ; page 295.

66. Ibid.

67. නොයෙල් ඩයස් පියතුමා: අන්තර්ජාතීය නීතිය, කොළඹ, 1990, 319 වන පිටුව.

68. එම 359, 360 වන පිටු.

69. රාමායණය. v.54.9-11.

70. ඩයස්, 1990,253 වන පිටුව.

71. එම, 269 වන පිටුව.

72. එම, 254,255 වන පිටු.

73. Dikshitar.; Ramachandra V.R.: War In Ancient India, London, 1948, page 72.